# ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව කරා ස්ත්‍රීවාදී ප්‍රවේශ විමසා බැලීම ශ්‍රී ලංකා කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතිය වෙතින් අත්දැකීම්



ගාල්ල දිස්ත්‍රික්කයේ කාන්තා මධ්‍යස්ථානයේ සේවයට කැපවූ කාර්ය මණ්ඩලය සහ දෙවැනි පෙළ නායකත්වය

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතිය(WVL-SL) 2019 සිට 2023 දක්වා වසර හතරක කාලපරිච්ඡේදයක් මුළුල්ලේ කාන්තාවන්ගේ සියළු විවිධත්වයන් නියෝජනය කරන කාන්තා අයිතිවාසිකම් සංවිධාන 60 ට වැඩි සංඛ්‍යාවක් සමඟ කටයුතු කළේය. ව්‍යාපෘතියේ මූලික ප්‍රවේශය වූයේ කාන්තාවන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව කරා ස්ත්‍රීවාදී ප්‍රවේශ ශක්තිමත් කිරීමයි. කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා, වගකීම්, සම්පත් කරා ප්‍රවේශය සහ ඒවා මත පාලනය, තීරණ ගැනීමේදී සහ අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ජීවිත තුළ කාන්තාවන් බලරහිත කරනු ලැබීම හඳුනාගැනීමේදී, පිළිගැනීමේදී සහ අවබෝධ කරගැනීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්ව වෙනසක් වෙනුවෙන් කාන්තාවන් සවිබල ගැන්වීම යන අවසාන අරමුණ වටා ගෙතුණු ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා ප්‍රවේශයක් යොදා ගත්තේය.

නව්‍ය සහ නව ප්‍රවණතාවකට මුළ පුරන විදේශ ප්‍රතිපත්ති ලේඛන ඉදිරිපත් කිරීමක් වන කැනඩාවේ ස්ත්‍රීවාදී ජාත්‍යන්තර සහාය ප්‍රතිපත්තිය මගින් ශක්තිමත් මඟ පෙන්වීමක් ලැබූ ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්ව සංවර්ධනය කරා සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන් සැකසීම කරා ස්ත්‍රීවාදී ප්‍රවේශයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වී ඇති ආකාරය විමසා බැලීමක් සිදු කළේය. කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් පැහැදිලිවම සහ බොහෝවිට ව්‍යංගයෙන් අනුගමනය කරනු ලබන සවිබල ගැන්වීම පිළිබඳ මතවාදය මුලින්ම විමසා බැලීම අගනා අවබෝධයක් සැපයුවේය. ස්ත්‍රීවාදය පිළිබඳ වැරදි අවබෝධය මත පදනම් වෙමින් කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන්ව 'ස්ත්‍රීවාදී සංවිධාන ලෙස හඳුන්වා ගැනීමට මුලින්

පසුබට විය. එනමුත් කාන්තා අයිතිවාසිකම් සංවිධාන වැඩ කරන 'ආකාරය' විමසා බැලූ විට ඔවුන් සත්‍ය වශයෙන්ම ස්ත්‍රීවාදී ප්‍රවේශ අනුගමනය කරමින් ස්ත්‍රීවාදී වැඩ 'කරන' ස්ත්‍රීවාදී සංවිධාන බව පෙනී ගියේය

## ස්ත්‍රීවාදී ප්‍රවේශ බල ගැන්වීම

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් වැඩ කිරීමේදී ස්ත්‍රීවාදී ප්‍රවේශ ශ්‍රී ලංකාවට අළුත් දෙයක් නොවන බවට වන පූර්ණ අවබෝධය මත දැඩිව පිහිටා කටයුතු කළේය. කාන්තා සවිබල ගැන්වීම කරා ස්ත්‍රීවාදී ප්‍රවේශ ඍජුව හඳුනා ගැනීමේ සංකල්පය න්‍යායාත්මක වශයෙන් අළුත් වුවත්, ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ කාන්තා ව්‍යාපාරය ස්ත්‍රීවාදීන් විසින් මෙහෙයවා ලැබ ඇති අතර සේම දශක අටකට වැඩි කාලයක සිට ස්ත්‍රීවාදී ප්‍රවේශ යොදාගෙන ඇත. තවදුරටත් එසේ කරමින් සිටී අප හැම විටම විමසූ ප්‍රශ්නය වූයේ "කවරෙකුට හෝ කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනයට වැඩ කළ හැක්කේ වෙනත් කවර ආකාරයකටද?" යන්නයි.

කාන්තාවන් සවිබල ගැන්වීමේ සාමූහික අරමුණක් කරා ශ්‍රී ලංකාවේ කාන්තාවන් කණ්ඩායම් ලෙස සංවිධානය වීමේ ඉතිහාසය දශක ගණනාවකට පෙර ඡන්ද බලය දිනා ගැනීම වෙනුවෙන් කාන්තාවන්ගේ සටන සහ නිදහස වෙනුවෙන් සටන දක්වා දිවෙයි. කාන්තාවන් කණ්ඩායම් ලෙස සකස් වී ඒ ඔස්සේ සංවර්ධන කතාවේ කොටසක් බවට පත් වීම උපායමාර්ග වල සහ අවධානය කේන්ද්‍රගත කිරීමේ වෙනස් කම් සහ සහභාගිත්වයේ සහ තත්ත්වයේ වෙනස්වන මට්ටම් සමඟ ඉතිහාසය පුරා වෙනස් වී ඇත. කාලයත් සමඟ, ස්ත්‍රීවාදී ක්‍රියාකාරීන් සහ සංවිධාන කාන්තාවන්ගේ අයිතිවාසිකම් රැසක් වෙනුවෙන් උද්දේශනයේ සහ බලපෑම් කිරීමේ යෙදීම සහ ඒවා දිනා ගැනීම සමඟ කාන්තාවන්ගේ ව්‍යාපාරය ශක්තිමත් වී තිබේ. ස්ත්‍රීවාදී සාකච්ඡාවේ / කථාවේ වැඩි කොටස ජාතික මට්ටමේ සංවිධානවල එක් රැස් වී තිබුණේ ප්‍රාදේශීය කාන්තා සංවිධාන කරා ඉන් ස්වල්පයක් පමණක් කාන්දු වෙමිනි. බොහෝ කාන්තා සංවිධාන කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩ කළ නමුත් තමන් ස්ත්‍රීවාදී ප්‍රවේශයන් ගන්නා ස්ත්‍රීවාදී සංවිධාන ලෙස හඳුනාගැනීම ප්‍රතික්ෂේප කළහ. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වඩ වඩාත් ප්‍රජා මට්ටමේ කාන්තා සංවිධාන සමඟ වැඩ කිරීම ඇරඹුවේ මෙවන් පසුබිමක් තුළය.

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය සමඟ හවුල්කාරිත්වයට එළඹෙන සංවිධාන සඳහා මූලින්ම පැවති ධාරිතා තක්සේරුවේදී, කාන්තා සංවිධානම ඔවුනට ධාරිතා වර්ධනය අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගත්හ. හෙළිදරව් කරගත් කරුණු පෙන්නුම් කළේ බොහෝ හවුල්කරුවන් ඔවුන්ගේ වැඩසටහන් සැකසීමේදී අයිතිවාසිකම් පාදක රාමුවක් භාවිතා කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව වර්ධනය කිරීම ඔවුන්ගේ වැඩවල හරය ලෙස තබා ගත් නමුත්, කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වඩාත්ම වැදගත් ලෙස ස්ත්‍රීවාදය කරා විවිධ සංකල්ප සහ ප්‍රවේශ අවබෝධ කරගැනීමේ අවිනිශ්චිත බවක් තවමත් තිබෙන බවයි. සංකල්පමය පැහැදිලිබව, සංකල්පමය රාමු සංවර්ධනය කිරීම් පිළිබඳ වඩා ගැඹුරු අවබෝධයක අවශ්‍යතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සබැඳි ගැටළු සම්බන්ධයෙන් ප්‍රවේශ සහ මූලධර්ම පිළිබඳ න්‍යායාත්මක දැනුමක අවශ්‍යතාව මෙම තක්සේරුව ඔස්සේ හඳුනාගත්තේය. කාන්තාවන් සමඟ වැඩ කිරීමේදී ස්ත්‍රීවාදී ප්‍රවේශයන් පිළිබඳව ධාරිතාව සහ තාක්ෂණික දැනුම කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට සපයනු ලැබිය යුතු බව මෙම තක්සේරුව නිර්දේශ කළේය.



මූලික ස්ත්‍රීවාදී සිද්ධාන්ත ඇතුළත් කරගනිමින්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය සහ එහි හවුල්කරුවෝ සමානාත්මතාව වැඩිදියුණු කිරීමට, කාන්තාවන්ගේ තේරීම් පුළුල් කිරීමට, ස්ත්‍රී පුරුෂ සමාජභාව පරතර තුරන් කිරීමට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහ කාන්තාවන් සහ පිරිමින් අතර සමතුලිත බලය බෙදී යාමක් පෝෂණය කිරීමට ප්‍රයත්න දැරූහ.

නුවරඑළියේ සමාජ සුබසාධන පදනමෙහි ක්‍රියාශීලී කාර්ය මණ්ඩල සාමාජිකාවන් මෙම ඡායාරූපයෙන් දැක්වේ.

මේ මත පදනම්ව, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ස්ත්‍රීවාදී සංකල්ප සහ ප්‍රවේශ හඳුන්වාදීමකට කොටස් තුනකින් යුතු පුහුණුවක් සකස් කළේය. දේශීය භාෂාවලින් (සිංහල සහ දෙමළ) සමන්විත වන මෙම පුහුණු වැඩසටහන් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය කණ්ඩායම විසින් සැලසුම් කරන ලද්දේ සංවර්ධන කටයුතු කරා ස්ත්‍රීවාදී ප්‍රවේශ පිළිබඳව අවබෝධය, දැනුම සහ පැහැදිලිබව වැඩිකිරීමේ සහ ව්‍යාපෘති සහ වැඩසටහන් චක්‍ර තුළ ස්ත්‍රීවාදී ප්‍රවේශ යොදාගැනීමේ කුසලතා වැඩිදියුණු කිරීමේ මූලික අරමුණු ඇතිවය.

ආසියා පදනම, ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ක්‍රියාකාරීන්ගේ සහ විවිධ මතධාරීන්ගේ / න්‍යායවාදීන්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය මුළුල්ලේම, කාන්තා අයිතිවාසිකම් සංවිධාන සත්‍ය වශයෙන්ම ස්ත්‍රීවාදී වැඩ 'කරමින් සිටින බවට ඔවුන් අතර අවබෝධය සියුම් ලෙස ඇති කිරීම සඳහා ධාරිතා ශක්තිමත් කිරීමට දායක විය.

ධාරිතා වර්ධනයේ එක් මූලික ප්‍රවේශයක් වූයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සැකසීම සහ ස්ත්‍රීවාදී වැඩසටහන් සැකසීම අතර වෙනස පිළිබඳව අවබෝධයක් ලබා දීමයි. කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන් යොදා ගනිමින් සිටි කාන්තාවන් සවිබල ගැන්වීමේ ප්‍රවේශ පිළිබඳව විවේචනාත්මකව සිතීමට පෙළඹුණු අතර “ප්‍රජාව තුළ කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ වෙනස් අයිතිවාසිකම්, කාර්යභාරයන් සහ වගකීම් සහ ඔවුන් අතර සබඳතා පිළිගැනීම පිණිස සමාජ-සංස්කෘතික සම්මතයන් සහ වෙනස් ආකාරයෙන් සැලකීම් අවබෝධ කරගනිමින් හා ඒවා සැලකිල්ලට ගනිමින් අපගේ වැඩ කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සැකසීම වේ.” යනුවෙන් ප්‍රකාශ කළහ.

“ස්ත්‍රීවාදී වැඩසටහන් සැකසීම යනු කාන්තාවන් වෙනුවෙන් සමානාත්මතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව පරිවර්තනීය වෙනස ප්‍රවර්ධනය කිරීමේ අවසාන අරමුණ සහිතව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සැකසීම අපට හමුවන සියළු පරතර වලට විසඳුම් සැපයීම පිණිස තවත් එක් පියවරක් ඉදිරියට තබමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සැකසීම වේ” යැයි කාන්තා අයිතිවාසිකම් සංවිධාන පැහැදිළි කළහ. කාන්තාවන් කුටුම්බය, ප්‍රජාව, සේවා ස්ථානය, දේශපාලන ක්‍රියාවලි සහ ආර්ථිකය තුළ ඉටු කරන කාර්යභාරයන්, සම්පත් කරා ඔවුනට ඇති ප්‍රවේශය සහ ඒවා මත ඔවුන් සතු පාලනය අවබෝධ කරගනිමින් සහ බල අසමතුලිතතා අවම කිරීමට ප්‍රයත්න දැරීම සඳහා කාන්තාවන් සහ පිරිමින් අතර බල අසමතුලිතතා හඳුනාගනිමින් විවිධ කාන්තා කණ්ඩායම් මත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ මුලපිරීම් මගින් ඇති කෙරෙන බලපෑම් පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ වැඩ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විශ්ලේෂණය වඩාත් හොඳින් භාවිතා කිරීම පිණිස කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට සහාය ලබා දෙන ලදී.



ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම යන සංකල්ප විවේචනාත්මකව තක්සේරු කිරීමට කාන්තාවන් පීඩාවට පත් කිරීමට මග පාදන ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව ශක්තිමත් කරවන බල අසමතුලිතතාවන්ට විසඳුම් සැපයීමේ තීරණාත්මක අවශ්‍යතාව ස්ත්‍රීවාදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව අතර සම්බන්ධය හවුල්කරුවන්ට සිහිපත් කරවීමට මෙන්ම වැඩකරන පරිසරය තුළ දක්නට ලැබෙන ප්‍රතිපත්ති, සංකල්ප සහ බැඳීම් සිහිපත් කරවීමට උපායමාර්ගික ධාරිතා වර්ධන මැදිහත්වීම් සැපයීමට ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය නිරන්තරයෙන් වෙහෙස දැරුවේය.

කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමඟ වැඩ කළ සිව් වසරක කාලය තුළ, සංවිධාන කාන්තාවන් සවිබල ගැන්වීමට වැඩ කිරීමේදී ඔවුන් සැබැවින්ම ස්ත්‍රීවාදී ප්‍රවේශයක් ගන්නා බව සාඩම්බරයෙන් පිළිගන්නා තත්වයට පත්වනු  ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය දුටුවේය. කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන්ගේ ස්ත්‍රීවාදී ප්‍රවේශයේදී, පිරිමින් හා සම මට්ටමෙන් කාන්තාවන් වෙනුවෙන් සමානාත්මතාව සහතික කිරීම පිණිස ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් සහ වෙනස් ආකාරයෙන් සැලකීම් තුරන් කිරීම මගින් කාන්තාවන් සවිබල ගැන්වීමට ප්‍රයත්න දැරූහ. කාන්තාවන් සහ කාන්තාවන් ලෙස හඳුනාගනු ලබන්නන් බලවත් පීඩාවට පත් කිරීම අවබෝධ කරගැනීමේදී, අනෙකුත් විවිධත්වයන් අතර වාර්ගිකත්වය, ආගම, ලිංගික නැඹුරුව, වයස, පන්තිය, ආදායම් මට්ටම්, පදිංචි ස්ථානය යන විවිධ අන්තර්සබඳතා සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව වෙනස්කම් කෙරෙහි අවධානය කේන්ද්‍රගත කළහ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීම සහ ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය කේන්ද්‍රගත කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී මුලපිරීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රවීණත්වය සහිත වන අතරම හවුල්කාර සංවිධානවලට,  ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වැඩසටහන් සැකසීමේ සිට ස්ත්‍රීවාදී වැඩසටහන් සැකසීම කරා සංක්‍රාන්තියට මග පෙන්වනු ලැබිණි. ස්ත්‍රීවාදී වැඩසටහන් සැකසීම පිළිබඳ වැඩිදියුණු වූ අවබෝධයේ ප්‍රතිඵලයක් ලෙස, හවුල්කාර සංවිධාන බල සබඳතාවන්ට අභියෝග කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා පිළිබඳ උපකල්පන ප්‍රශ්න කිරීම සහ අයිතිවාසිකම් පාදක ප්‍රවේශයක් දැඩි ලෙස අනුගමනය කිරීම අනිවාර්ය බව හඳුනාගත්හ. වැඩසටහන් ස්ත්‍රීවාදී ප්‍රවේශයකට පෙළ ගස්වා ගැනීම සඳහා විශ්වාසය ගොඩනැගීමේ, අවබෝධය පෝෂණය කිරීමේ, ස්වයං දැනුවත්බව ප්‍රවර්ධනය කිරීමේ ආකල්ප වෙනස් කිරීමේ සහ සංකීර්ණ පරිවර්තනීය වෙනස මැනීමේ වැදගත්කම ඔවුහු පිළිගත්හ.

මුලතිව් දිස්ත්‍රික්කයේ යුගශක්ති කාන්තා සම්මේලනයේ කැපවූ කාර්ය මණ්ඩල සාමාජිකාවන් මෙම ඡායාරූපය පෙන්නුම් කරයි.

## ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතියේ සහාය ඇතිව හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් කරනු ලබන වැඩ ස්ත්‍රීවාදී වන්නේ කෙසේද?

කාන්තාවන්ගේ විවිධ ගැටළු සම්බන්ධයෙන් ප්‍රජා මට්ටමින් වැඩ කරන අතරතුර, කාන්තාවන් සවිබල ගැන්වීමට මග පාදනු ඇත යන බලාපොරොත්තුවෙන් ඔවුන් වැඩසටහන් මෙහෙයවන්නේ ඇය මෙහෙයවනු ලබන වැඩසටහන් වර්ග, ඒවා මෙහෙයවනු ලබන ආකාරය සහ ඒවා ඉලක්ක කරන්නේ කවුරුන්ද සහ එම වැඩ මගින් ඇති කෙරෙන ධනාත්මක සහ පරිවර්තනීය වෙනස්කම් වලින් ප්‍රතිලාභ ලබන්නේ කවුද යන කරුණු විමසා බලමින් ඔවුන්ගේ වැඩ විවේචනාත්මකව සමාලෝචනය කිරීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන නිරන්තරයෙන් දිරි ගන්වනු ලැබිණි.

ප්‍රතිඵල විමසා බැලීම ව්‍යාපෘතියේ විවිධ අවස්ථා වලදී සිදු කෙරිණි. ඔවුන්ගේම වැඩ සහ සංශෝධන සහ වෙනස්කම් වෙනුවෙන් අවකාශය කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් විවේචනාත්මකව සමාලෝචනය කරනු ලැබීමට මෙය හැකියාව ඇති කළේය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ප්‍රශ්න මගින් මෙම විවේචනාත්මක ස්වයං විශ්ලේෂණය උත්තේජනය කළේය.

ඇයි යන ප්‍රශ්නයට කාන්තා සංවිධාන විසින් දක්වන ලද මුල් ප්‍රතිචාර "දැනුම ලබා දීමට", "වෙනස ඇති කිරීමට" සහ "අයිතිවාසිකම් පිළිබදව දැනුවත්බව ඇති කිරීමට" වැනි ඒවා වූ නමුත් සාකච්ඡා සහ විමසා බැලීම් වල ප්‍රතිඵලයක් ලෙස අවසානයේදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන් "කාන්තා අයිතිවාසිකම් ආරක්ශා කිරීමට / තහවුරු  කිරීමට" වැඩ කරන බව පිළිගත්හ.

එසේවුවද, කාන්තා අයිතිවාසිකම් සංවිධාන 'ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව' අත් කර ගැනීමට තමන් විසින් සිදු කරන කාර්යන් ස්ත්‍රීවාදී වන බවට හඳුනාගැනීමේ අරගලයක නිරත වෙමින් තමන් ස්ත්‍රීවාදී වැඩ 'කරන' බව ප්‍රකාශ කිරීමට තවදුරටත් පසුබට වූහ. ඇතැම් සංවිධාන, 'සමාජය පිළිගන්නවා අපි  'ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය වෙනුවෙන් වැඩ කරන බව නමුත් අපි එය ස්ත්‍රීවාදය ලෙස හැඳින්වූ විට ඒ අයට ඒක පිළිගන්න බැහැ'යන ගැටළුව මතුකර ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් පිළිතුරු අපේක්ෂා කළහ. මෙය බොහෝ දුරට සැබැවින්ම ස්ත්‍රීවාදය යනු කුමක්ද යන්න පිළිබඳව දැනුවත්කම නොමැති වීම හේතුවෙන් හෝ 20 වැනි සියවසේ මුල් භාගය අතරතුර ස්ත්‍රීවාදී ප්‍රවේශවල ප්‍රචණ්ඩකාරී විරෝධතා ස්වරූපයක් තිබීම සහ වර්තමාන වැඩ කරන පරිසරය තුළ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමට ප්‍රචණ්ඩත්වය සම්බන්ධ කර ගැනීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන අකමැති වීම හේතුවෙන් විය හැකිය යන සිතිවිලි ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය උත්තේජනය කළේය. කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් සටනට ප්‍රචණ්ඩ නොවන විවිධ මෙහෙයුම් ක්‍රම රැසක් තිබෙන බව පිළිගනිමින් ස්ත්‍රීවාදය ශ්‍රී ලංකාව වැනි රටවල් වලට නොගැලපෙන බටහිර මතවාදයක් වන බවට පවතින වැරදි අවබෝධය මතින් මෙම තත්ත්වය පැන නැගීමට ඉඩ ඇති බව කාන්තා අයිතිවාසිකම් සංවිධාන සිතූහ. කාන්තාවන්ට සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමට පුරුෂාධිපත්‍යය බිඳ දැමීම අත්‍යවශ්‍ය වීම විශ්වීය සත්‍යයක් බවටත්, බටහිර-පෙරදිග වෙනස ඇත්තේ ස්ත්‍රීවාදය බිඳ දැමීමට අපේක්ෂා කරන පුරුෂාධිපත්‍ය ව්‍යුහයන් කෙරෙහි සම්මතයන් සහ සංස්කෘතීන් වල බලපෑම මත පමණක්ම වන අතර මතවාදයේ නොවන බවටත් සාකච්ඡා සහ අවබෝධයට මෙය මග පෑදුවේය. ඉන්පසුව, "ස්ත්‍රීවාදය යනු ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව වෙනුවෙන් පෙනී සිටින ව්‍යාපාරයක්" බවටත් "ස්ත්‍රීවාදයේ ඉලක්කය සැමට සමානව සලකනු ලැබීම" බවත් පිළිගැනීමක් ක්‍රමක්‍රමයෙන් ඇති විය.

කාන්තාවන් වෙනුවෙන් සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමේදී දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා කෙරෙන ක්‍රම (අධ්‍යාපනය සහ දැනුම බෙදාගැනීම, දැනුවත් කිරීම, බලමුළු ගැන්වීම සහ සාමූහික සහ කණ්ඩායම් සකස් කිරීම, කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම කාන්තාවන් මුහුණ දෙන වෙනස් ආකාරයෙන් සලකනු ලැබීමේ සහ ප්‍රචණ්ඩත්ව ගැටළු වෙනුවෙන් යුක්තිය කරා ප්‍රවේශ වීම හරහා) පිළිබඳ හවුල්කරුවන් කථා කළ අතර කාන්තා අයිතිවාසිකම් සහ කාන්තාවන් බලවත් පීඩාවට

පත්වීම සහ ඔවුනට වෙනස් ආකාරයෙන් සලකනු ලැබීම පිළිබඳව ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයකින් දැනුවත් වීම මගින් සහ කාන්තාවන් කොන් කරන හා ඔවුනට වෙනස් ආකාරයෙන් සලකන දිගින් දිගටම පවතින සමාජ සම්මතයන් සහ ව්‍යුහයන් හඳුනාගෙන ඒවාට අභියෝග කිරීමට කාන්තාව ප්‍රවර්ධනය කිරීම මගින් හා ස්ත්‍රීවාදී මූලධර්ම වැඩසටහන් සැකසීමට ඇතුළත් කිරීම මගින් මෙම ක්‍රම ශක්තිමත් කර එලෙස සමානාත්මතාව වෙනුවෙන් උද්දේශනය සහ බලපෑම් කිරීමට කාන්තාවන්ට හැකියාව ලබා දීමේ අවශ්‍යතාව ඔවුහු හඳුනාගත්හ. වැඩි සවිබල ගැන්වීම, ඇතුළත් කර ගැනීම සහ සමාන හවුල්කාරිත්වය වෙනුවෙන් හැකියාව ඇති කරවන පරිසර ප්‍රවර්ධනය කරන (හෝ ඇතැම්විට ඒවාට බාධා ඇති කරවන) ඔවුන්ගේම ස්ථාවරයන් විවේචනාත්මකව පරීක්ෂා කිරීමට ස්ත්‍රීවාදී මූලධර්ම ඔවුන්ගේ සංවිධානවලට හැකියාව ලබා දෙනු ඇති බව කාන්තා සංවිධාන දැඩි ලෙස විශ්වාස කළහ. කාන්තා අයිතිවාසිකම් පිළිබඳව ස්ත්‍රීවාදී සාකච්ඡාවේ අඛණ්ඩ ගම්‍යතාව සහතික කිරීමට ඔවුන් සතු බලය ද ඔවුහු හඳුනා ගත්හ.

කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් සිදු කරනු ලබන වැඩ පිළිබඳව ආවර්ජනයක්, දැනට පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා සහ බල ගතිකයන් වෙතින් පැන නගින කාන්තාවන්ගේ ප්‍රායෝගික ස්ත්‍රී පුරුෂ සමාජභාව අවශ්‍යතාවන්ට විසඳුම් සැපයීම පිණිස ඔවුන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව කෙරෙහි කේන්ද්‍රගත වීමක් අවධාරණය කරයි. ඒ හා සමගාමීව, ඒ හා සමානම වැදගත්කමක් ලබා දෙමින්, කාන්තා අයිතිවාසිකම් සංවිධාන කල් පවත්නා සහ පරිවර්තනීය වෙනසක් වෙනුවෙන් කාන්තා අයිතිවාසිකම් ශක්තිමත් කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් උපායමාර්ගික ස්ත්‍රී පුරුෂ සමාජභාව බැඳියාවන් ඉලක්ක කරන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ද ප්‍රයත්න දරති. එහි ප්‍රතිඵලයක් ලෙස, දැන් ඔවුහු ඔවුන්ගේ වැඩ දෙස ස්ත්‍රීවාදී කෝණයකින් බලති.



මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (පුත්තලම් දිස්ත්‍රික්කය) පසු පස සිටින ගාමක බලවේගය - එම සංවිධානයේ කැපවූ කාර්ය මණ්ඩලය මෙම ඡායාරූපයෙන් දැක්වේ.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධානවල කළමනාකාරිත්වය සහ ස්තිරසාරබව ශක්තිමත් කිරීමට ස්ත්‍රීවාදී ප්‍රවේශයන්

ව්‍යාපෘතිය අතරතුරදී, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය මගින් අරමුදල් සම්පාදිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් ලද සහාය සහභාගිත්වය ඇතුළත් කර ගැනීම සහ සවිබල ගැන්වීම යන ස්ත්‍රීවාදී සංවර්ධනයේ ප්‍රධාන මූලධර්ම තුන මගින් නිරන්තරයෙන් මග පෙන්වනු ලැබූ කළමනාකරණ සහ මෙහෙයුම් ධාරිතා පිළිබඳ ප්‍රායෝගික දැනුම හුවමාරු කිරීමක් ලෙස ක්‍රියා කළේය.

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය සහ ප්‍රජා මට්ටමේ කාන්තා අයිතිවාසිකම් සංවිධාන අතර මෙම නිරතවීමට අසමමිතික බල ගතිකයන් වෙනුවෙන් අවකාශය තිබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය හැමවිටම සැලකිලිමත් විය. එබැවින්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය හවුල්කරුවන්ගේ තීරණවලට සහ තනි පැවැත්මට ගරු කරමින් වැඩසටහන් කළමනාකරණය සහ මෙහෙයුම් පරිචයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් සහාය ලබා ගැනීමට ඔවුන්ගේ උනන්දුව සහ කැමැත්ත අඛණ්ඩව සහ පැහැදිලිවම බලාපොරොත්තු විය. පරිචයන්හි වෙනස්කම් හා සම්බන්ධ සාකච්ඡා සමාන හවුල්කාරිත්වය පිළිබඳ හැඟීමකින් හවුල්කරුවන් සමඟ සිදු කෙරිණි. හවුල්කරුවන්ගෙන් බහුතරය මෙවැනි සහාය කැමැත්තෙන් පිළිගත්හ. බොහෝ හවුල්කාර සංවිධාන නව හෝ වෙනස්

කළමනාකරණ සහ මෙහෙයුම් මෙවලම් යොදාගැනීම හා පද්ධති වැඩිදියුණු කිරීම තුළින් මෙම නිරතවීම් හරහා සිදු වූ ඇතැම් වෙනස්කම් ප්‍රකට විය. ස්ත්‍රීවාදී සංවිධානමය දැක්ම, මෙහෙවර සහ අරමුණු සහතික කිරීම, අධීක්ෂණ සහ ඇගයුම් රාමු, උපායමාර්ගික සැලසුම් සහ පරිපූර්ණ මූල්‍ය පද්ධති සහ අරමුදල් රැස් කිරීමේ සැලසුම් සකස් කර තිබීම කළමනාකරණය කරා නව ප්‍රවේශයනට ඇතුළත් වන අතර ඒවාට පමණක් එම නව ප්‍රවේශ සීමා නොවී තිබියදී මෙහෙයුම් දෘෂ්ටිකෝණයකින් බැලූ කළ පරිපූර්ණ වාර්ෂික වැඩ සැලසුම් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් මනා ලෙස නිශ්චය කරන ලද රැකියා විස්තර සහ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රම එහි නව ප්‍රවේශයන් අතර වේ.

හවුල්කාර කාන්තා සංවිධාන මුලින්ම තේරීමේදී එය එක් එක් සංවිධානයේ කාර්ය මණ්ඩලය තුළ සහ කළමනාකරණ මණ්ඩල තුළ සිටින කාන්තාවන් ප්‍රතිශතය මත රඳා පැවතිණි සෑම සංවිධානයකම තීරණ ගැනීමේ, කළමනාකරණයේ සහ මෙහෙයුම් ක්‍රියාවලි වල බහුතර පාර්ශ්ව කරුවන් කාන්තාවන් බවට සහතික වීම පිණිස ව්‍යාපෘතිය මුළුල්ලේම ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය මෙම සංඛ්‍යා පිළිබඳව අවධානයෙන් පසු විය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ලත් අත්දැකීම වූයේ කාන්තාවන්ගේ ඉහළ ප්‍රතිශතය සංකේතාත්මක නොවූ බවයි. ව්‍යාපෘතිය මුළුල්ලේම සියළු හවුල්කාර සංවිධානවල කාන්තාවන්ගේ හඬ සහ බලය සක්‍රියව පැවති බව පැහැදිලිව පෙනුණි.

මනා ලෙස නිශ්චය කරන ලද හා ස්ත්‍රීවාදී සංවිධානමය දැක්මක්, මෙහෙවරක් සහ අරමුණු, සංවිධානමය උපායමාර්ගික සැලැස්මක් හෝ ව්‍යවස්ථාවක්, මනා ලෙස නිශ්චය කරන ලද තේමාගත ක්ෂේත්‍ර, භූගෝලීය ආවරණය, ප්‍රතිලාභීන් සහ පාර්ශ්ව කරුවන් මෙන්ම සංවිධානය වෙනුවෙන් සමස්ත වාර්ෂික වැඩ සැලැස්ම යොදවනු ලැබ තිබීමට හවුල්කරුවන්ට සහාය සැලසීම සමඟ සංවිධානමය කළමනාකරණය තුළද ස්ත්‍රීවාදී ප්‍රවේශ සහතික කරනු ලැබිණි සංවිධානමය ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිපත්ති සහ ලිංගික අඩන්තේට්ටම් ප්‍රතිපත්ති සකස් කිරීමටද හවුල්කරුවන්ට තවදුරටත් සහාය සැපයිණි.

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ තුළට ස්ත්‍රීවාදී ප්‍රවේශ ඒකාබද්ධ කිරීමට ද ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය මගපෙන්වීම සහ සහාය ලබා දුන්නේය. තක්සේරු සැලසුම් කිරීමේදී සහ පර්යේෂණ සැලසුම් සහ දත්ත රැස්කිරීමේ මෙවලම් සකස් කිරීමේදී ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයකින් බැලීමට ඉගෙනුම මෙන්ම පුහුණු සඳහා ප්‍රතිලාභීන් තේරීමේදී ඇතුලත් කර ගැනීම සහ සවිබල ගැන්වීම යන දෘෂ්ටිකෝණ භාවිතා කිරීමට ඉගෙනුම හවුල්කරුවන් එතෙක් කරමින් සිටි වැඩම වඩාත් අර්ථවත් ආකාරයෙන් කිරීමට අවස්ථාව සැලසීය. ඔවුන්ගේ කාර්යයන් කාන්තාවන් සවිබල ගැන්වීමට ස්ත්‍රීවාදී සහ අයිතිවාසිකම් පාදක ප්‍රවේශ කෙරේ වඩාත් ශක්තිමත්ව කේන්ද්‍රගත කිරීමට මෙය හවුල්කරුවන්ට තවදුරටත් හැකියාව ලබා දුන්නේය.

කාන්තා අයිතිවාසිකම් සංවිධානවල කළමනාකරණ සහ මෙහෙයුම් ධාරිතා වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් සහාය ප්‍රධාන වශයෙන්ම හවුල්කරුවන් විසින්ම හඳුනාගනු ලැබූ සැලසුම්, උපායමාර්ග සහ ක්‍රියාපටිපාටි සකස් කිරීමේදී බහු වාර්ෂික අරමුදල් සම්පාදන සහාය සහ රැකියාවේ යෙදෙන අතර මග පෙන්වීමේ සහාය මෙන්ම සංවිධානවලටම එය සිදු කර ගැනීම සඳහා පුහුණුව හරහා ධාරිතා වර්ධනය තුළින් ඍජුවම සහාය සැපයීම ආකාරයෙන් විය. සකස් කරන ලද සැලසුම් සහ උපායමාර්ග වලට හවුල්කරුවන් දායකවන බවට හා ඒවායේ හිමිකාරීත්වය දරන බවට වගබලා ගැනීමටත් එමගින් අනාගතයේදී සංවිධානයේ පාලනය සහ කළමනාකරණය තුළ මෙම සැලසුම් හා උපායමාර්ග ප්‍රායෝගිකව ආදේශ කරගැනෙනු ඇති බවට වගබලා ගැනීමටත් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය විසින් ස්ත්‍රීවාදී හා උද්දේශක ප්‍රවේශ භාවිතා කරනු ලැබිණි හවුල්කරුවන්ගේ සාකච්ඡා අතරතුරදී, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ඔවුන්ගේ සැලසුම් සහ උපායමාර්ග තක්සේරු කිරීම එබඳු ක්‍රියාවලි යෙදවීමේ වැදගත්කම ඔවුනට ඒත්තු ගැන්වූ බවද බොහෝ කාන්තා අයිතිවාසිකම් සංවිධාන ප්‍රකාශ කළහ. මෙම ප්‍රතිඵල අත් කර ගනු ලැබුණේ හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට සහ ශ්‍රී ලංකාවේ සමස්ත සංවර්ධන අංශයට සන්දර්භමය වශයෙන් අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළය යන්න ශ්‍රී ලංකාවේ

කාන්තා හඬ සහ නායකත්වය උගත් කරුණක් විය. කොවිඩ් -19 ගෝලීය වසංගතය විසින් සහ රටේ ආර්ථික අර්බුදය හා ඉන් පසුව පැමිණි මානුෂීය අර්බුදය විසින් නිර්මාණය කරන ලද හදිසි අවශ්‍යතාවන් කෙරේ අවධානය කේන්ද්‍රගතව තිබූ අවධියක ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාලසීමාව කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිණිස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අතිශයින්ම අභියෝගාත්මක කාලයක් විය. එය, පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට, කාර්ය මණ්ඩල තබා ගැනීමට සම්පත් උපරිමකරණයට සහ සෞඛ්‍ය සහ ආරක්ෂා ප්‍රමිති පවත්වා ගන්නා අතර ප්‍රතිලාභීන්ට සේවය කිරීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන අරගලයක යෙදී සිටි කාලපරිච්ඡේදයක් විය. එසේම එය, කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ වැඩ කිරීමේදී අනුගමනය කළ ක්‍රම නවීන සහ මාර්ගගත වැඩ බවට අනුවර්තනය කිරීම, එසේ කිරීමට සීමිත සම්පත් හා දැනුම ඇතිව ඉගෙන ගනිමින් සිටි යුගයක් විය. යෝජනා සකස් කිරීමට පෙර භාවිතා කරන ලද ප්‍රජා අදහස් විමසීමේ ක්‍රියාවලීන් සංචරණ සීමා මගින් ඍණාත්මක බලපෑමට ලක් වූ යුගයක් විය. එමෙන්ම, ආධාර සපයන්නන්ගේ අරමුදල් සම්පාදන ප්‍රමුඛතාව අයිතිවාසිකම් සහ සවිබලගැන්වීම කේන්ද්‍රකරගත් වැඩ වලින් කාන්තා අයිතිවාසිකම් සංවිධාන බොහොමයකට අළුත් හා නුහුරු ක්ෂේත්‍රයක් වූ ගෝලීය වසංගතයට ප්‍රතිචාර දැක්වීම කරා වෙනස් වූ යුගයක් විය. මෙම බාහිර අභියෝග තිබියදීත්, කාන්තා අයිතිවාසිකම් සංවිධාන, කාන්තාවන් සවිබල ගැන්වීම සහතික කිරීමේ සහ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ඔවුන්ගේ අවසාන අරමුණු වල දැඩිව පිහිටා කටයුතු කළ අතර ඔවුන් විසින් මුහුණ දෙනු ලැබූ යථාර්ථයන් සහ අභියෝග ගෙනා ඉගෙනුම සහ අවබෝධය හවුල්කාර කාන්තා සංවිධානවල පමණක් නොව සමස්තයක් ලෙස කාන්තා ව්‍යාපාරයේ ඔරොත්තු දීම පිළිබඳව බොහෝ පාඩම් ඉගැන්වීය.

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් සිදු කරනු ලබන ගුණාත්මක සේවා සැපයුම සහ උද්දේශනය වඩාත් උසස් කිරීම සඳහා ස්ත්‍රීවාදී ප්‍රවේශ

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය, ගුණාත්මක සේවා සැපයීම සහ ඵලදායී උද්දේශන ව්‍යාපාර මගින් පරිවර්තනීය වෙනසක් සඳහා උද්දේශනයට කාන්තා අයිතිවාසිකම් සංවිධානවල ව්‍යාප්තිය වර්ධනය කිරීම වෙනුවෙන් කාන්තා සංවිධානවල ධාරිතා ශක්තිමත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රාදේශීය කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් සිදු කරනු ලබන ගුණාත්මක සේවා සැපයුම සහ උද්දේශනය වඩාත් උසස් කිරීම සඳහා වැඩ කළේය.

මෙම ගමනේදී, සියල්ලන් ඇතුළත් කර ගැනීම ප්‍රධාන ක්ෂේත්‍රයක් විය. කාන්තාවන් දෙස සමජාතීය කණ්ඩායමක් ලෙස නොව විවිධත්වයෙන් යුතු කාණ්ඩයක් ලෙස බලන විට කාන්තාවන් සවිබල ගැන්වීමට සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනයට වැඩ කිරීම වඩාත් සඵලදායක බව කාන්තා අයිතිවාසිකම් සංවිධාන දැඩිව විශ්වාස කරයි. ආබාධිතත්ත්වය, පන්තිය, කුලය, පදිංචි ස්ථානය, වාර්ගිකත්වය සහ ආගම, භාෂාව, වයස, සමාජ තත්ත්වය වැනි ගැටළු වලින් බලපෑමට ලක් වූ කාන්තාවන් යන සමජාතීය කණ්ඩායම තුළ කොන් කිරීමේ මානයන් අවබෝධ කර ගැනීමේදී, සංස්කෘතියේ සහ සාම්ප්‍රදායික නීතිවල බලපෑම කොන් කිරීම නිර්මාණය කරන බොහෝ අන්තර්සබඳතා සහිත ගැටළු අතර වන බව පෙනී යයි.

බලමුළු ගැන්වීම, ප්‍රජාව තුළ කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට වෙනස් ආකාරයෙන් සලකන සහ ඔවුන් කාන්තා අයිතිවාසිකම් සහ සවිබල ගැන්වීම භුක්ති විඳීම කෙරෙහි බලපෑම් ඇති කරන ගැටළු වලට එරෙහිව හඬක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජාවේ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නන්, තොරතුරු සපයන්නන් හෝ නායකයන් බවට පත්වීම සඳහා කණ්ඩායමක් ලෙස සංවිධානය වීම සඳහා යම් කාලපරිච්ඡේදයක් මුළුල්ලේ කාන්තාවන් ශක්තිමත් කිරීම, උපදෙස් දීම හා මග පෙන්වීම යන ක්‍රියාවලිය සලකා බලන බව තම හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සංවිධානවල වැඩ හරහා ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය උගත්තේය. තනි සාමාජිකාවන් ලෙස



WVL-SL හි අවසාන ඉලක්කය වන කාන්තාවන් සහ ගැහැණු ළමයින්, විශේෂයෙන් ආන්ත්‍රීකරණය කරන ලද සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් භුක්ති විඳීම ඉහළ නැංවීම සඳහා අන්තරකරණය සහ සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා අන්තර්කරණ ක්‍රමවේදයන් සහ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම පිළිබඳ ඉගෙනුම් ක්‍රියාවලිය සෘජුවම සම්බන්ධ වේ. ඡායාරූපයේ දැක්වෙන්නේ ආබාධ සහිත කාන්තා සංගමයේ (අනුරාධපුර දිස්ත්‍රික්කය) ඒ සඳහා කැපවූ කාර්ය මණ්ඩලයයි.

හෝ ස්වාධීන ආයතන හෝ වඩා විශාල බල මුළු ගන්වන ලද සංවිධානවල අනු කණ්ඩායම් හෝ ඒකක ලෙස සිවිල් සමාජ සංවිධානවලට බැඳීමට හෝ ඒවා පිහිටුවා ගැනීමට බලමුළු ගන්වන ලද කාන්තාවන්ගේ සාමූහික ශක්තීන් කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීම සහ සමාජ සවිබල ගැන්වීම කරා මෙහෙයවනු ලැබේ.

දැනුවත්බව ඇති කිරීම උපදේශනයේ  පදනම බවද ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය උගත්තේය. වැඩි වැඩියෙන් කාන්තාවන් සහ ගැහැණු ළමුන් ඔවුන්ගේ අයිතිවාසිකම්, නීති,හිමිකම් සහ ඔවුනට ලබා ගත හැකි සේවාවන් පිළිබඳව දැනුවත්ව සිටී නම්, ඔවුන් අයිතිවාසිකම් ඉල්ලා සිටීමට, අයිතිවාසිකම් උල්ලංඝණය කරනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සහ යුක්තිය පැතීමට වැඩි ප්‍රවණතාවක් නිර්මාණය  වනු ඇත.

කාන්තාවන්ට එරෙහි කොන් කිරීමට හා වෙනස් ආකාරයෙන් සැලකීමට හේතුවන අසාධාරණ සම්මතයන්, පරිචයන් සහ ව්‍යුහයන්ට සඵලදායක විසඳුම් සැපයීමේදී හා ඒවා වෙනස් කිරීමේදී දැනුවත්බව ප්‍රධානය. සමාජීය, සංස්කෘතික සහ ආගමික වශයෙන් පවත්නා ස්ත්‍රී විරෝධයේ බාධක බිඳ දැමීමට කාන්තාවන් වෙනුවෙන් බලසම්පන්න මෙවලමක් ලෙස දැනුවත්බව ක්‍රියා කරයි. කාන්තාවන් සිවිල් සමාජ සංවිධානවලට නායකත්වය දෙන විට සහක්‍රියාවන් නිර්මාණය කරන විට සහ වෙනස් ආකාරයෙන් සැලකීමට එරෙහිව කාන්තාවන්ගේ හඬ වර්ධනය කරන විට කාන්තා අයිතිවාසිකම් සංවිධානවල වැඩ පිළිබඳ වැඩි දැනුවත්බව සාමූහිකත්වය සමඟ සම්බන්ධ වේ. මෙය කාන්තාවන් වෙනුවෙන් සමානාත්මතාව සහ යුක්තිය අත් කර දෙන සමාජ නෛතික සහ ප්‍රතිපත්ති මට්ටමේ වෙනස වෙනුවෙන් උද්දේශනයට කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට හැකියාව ලබා දුන්නේය. කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන්ගේ සේවාලාභීන්ව තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටීමට ශක්තිමත් කරවනවා පමණක් නොව ඔවුහු කාන්තාවන් වෙනුවෙන් සම්බන්ධතා නිර්මාණය කිරීම සහ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම සඳහා දායක වීමේ හැකියාව සහිත වගකීම් දරන්නන්ගේ දැනුම සහ දැනුවත්බව වැඩි කිරීමටද කටයුතු කරති.

වැඩි දියුණු වූ සේවා සැපයුම සහ උපදේශනය වෙනුවෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය විසින් සපයන ලද සහාය නිරන්තයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය කරා වන ස්ත්‍රීවාදී ප්‍රවේශ තුළ රැඳී තිබුණි ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් සහාය ලද ව්‍යාපෘති හරහා විවිධ සේවාවන් රැසක් සපයනු

ලැබිණි. හුදෙක් තොරතුරු බෙදා හැරීමේ මෙවලම් වලට වඩා යමක් ලෙස සේවා සැපයුම දෙස වඩාත් උපායමාර්ගික ලෙස බැලීමටත්, එය රික්තයක් තුළ සිදුවන හුදකලා ක්‍රියාකාරකමක් නොව වඩා විශාල ස්ත්‍රීවාදී න්‍යායපත්‍රයකට දායක වන යමක් ලෙස සේවා සැපයුම දැකීමටත් කාන්තා අයිතිවාසිකම් සංවිධාන විකාශය වන අයුරු ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය දුටුවේය. කාන්තා අයිතිවාසිකම් සංවිධාන මෙලෙස ආරක්ෂණවාදයේ සිට අයිතිවාසිකම් කරා ගමන් කරමින් කාන්තාවන් සවිබල ගැන්වීමේ සිය සමස්ත අරමුණු ඉටු කර ගැනීම සඳහා විවිධ සේවාවන් සමෝධානය කළහ; ඇතැම් සංවිධාන ක්ෂුද්‍ර ණය සේවා සැපයුම හරහා ආර්ථික සවිබල ගැන්වීම සමඟ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර සමෝධානය කිරීම වැනි තේමාගත ක්ෂේත්‍ර මිශ්‍ර කිරීම කර වාණිජ ලිංගික ශ්‍රමිකයන්ගේ වැනි සැණෙකින් වෙනස්වන රැකියාවන් මගින් සහ ඇඟළුම් කම්හල් සේවිකාවන් වැනි අය විසින් කරනු ලබන අඩු කුසලතා මට්ටමේ වැඩ ලෙස දකිනු ලබන රැකියා මගින් මුහුණ දීමට සලස්වනු ලබන ආර්ථික ආතතිය සමනය කිරීමට විකල්ප ජීවනෝපාය මගින් ආදායම් මට්ටම් වැඩි කිරීමේ සේවා සැපයූහ. කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තාවන්ගේ නැගී එන සේවා අවශ්‍යතා පිළිබඳව වඩාත් දැනුවත් වූ අතර සපයන්නන් මෙන්ම ලබන්නන් ලෙස පිරිමින් සේවා සැපයුම් ක්‍රියාකාරකම් තුළට ගෙන එමින් කිසිදු කාන්තාවක අතහැර දමනු නොලබන බවටත් බැහැර කිරීම තුළින් කිසිදු හානියක් සිදු නොවන බවටත් සහතික වීමට කිසිදු හානියක් නොකිරීමේ මූලධර්ම සම්බන්ධ කර ගනිමින් ඒවාට ප්‍රතිචාර දැක්වූහ.

## ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව අත්කර ගැනීමට ස්ත්‍රීවාදී ප්‍රවේශ

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය වෙතින් තාක්ෂණික සහ මූල්‍ය යන දෙආකාරයේම සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රතිඵල කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ බොහෝ සෙයින්ම ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතා දෘෂ්ටිකෝණයකිනි. කෙසේවතත්, ස්ත්‍රීවාදය පිළිබඳව සංකල්පමය පැහැදිලිබව අත්කර ගැනීම සහ තමන් ස්ත්‍රීවාදී ප්‍රවේශ භාවිතා කරන ස්ත්‍රීවාදී සංවිධාන වලට අයත් ස්ත්‍රීවාදීන් ලෙස හඳුන්වා ගැනීමට මුලින් තිබූ අකමැත්තෙන් ඉවත් වීම හවුල්කරුවන්ට ඔවුන්ගේ ප්‍රවේශ සැබැවින්ම ස්ත්‍රීවාදී බව වටහාගෙන පිළිගැනීමට හැකියාව ලබා දුන්නේය.

ප්‍රජා මට්ටමේදී, ඉලක්කගත වැඩසටහන් හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාව ගතිකයන් සහ කාන්තා අයිතිවාසිකම් ගැටළු පිළිබඳව ප්‍රජාවන්ගේ සහ ප්‍රාදේශීය සේවා සපයන්නන්ගේ දැනුවත්බව සහ සංවේදීබව වැඩි කිරීමට ඔවුනට හැකි වූ බව හවුල්කරුවෝ පවසති.ඔවුන් විසින් කරන ලද කාර්යයන් දේශපාලනික වශයෙන් සක්‍රිය වීමට, ප්‍රජා පාදක සංවිධාන වලට නායකත්වය දීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් රජයේ පාර්ශ්ව කරුවන් සමඟ සාකච්ඡා වලට යොමු වීමට සහ කාන්තාවන්ගේ අභිලාෂයන්ට ආධාරක වෙමින් ප්‍රජා මට්ටමේ කාන්තා සහභාගිත්වය වැඩි වීමට හේතු පාදක වී ඇති බව ඔවුන්ගේ තක්සේරුවයි. කුටුම්බය තුළ වගකීම් බෙදා ගැනීම වැඩි වීමක් සහ නිවස තුළ කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ තත්ත්වය ඉහළ යාමක් ද කාන්තා සංවිධාන නිරීක්ෂණය කර ඇත.

ප්‍රජාවෙන් ඔබ්බට යමින්, කාන්තා සංවිධාන පවසන්නේ ඔවුන් සැලකිය යුතු ජයග්‍රහණ අත් කරගෙන තිබෙන බවයි. කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් උපදේශනයේදී සහ පුද්ගලික සමාගම් සහ රජය වගවීමට සැලැස්වීමේදී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කළ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය සමිති ඔවුන් සාර්ථක ලෙස පිහිටුවා තිබේ.

තේ වතු ප්‍රජාවන් තුළ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීමට ඔවුන් දිගින් දිගටම දරන ප්‍රයත්න වල ප්‍රතිඵලයක් ලෙස, සාමූහික ගිවිසුම් හරහා විශේෂයෙන්ම සෞඛ්‍ය අයිතිවාසිකම් හා සබැඳි ක්ෂේත්‍ර තුළ සේවිකාවන්ගේ අයිතිවාසිකම් නීති හා ප්‍රතිපත්ති සංශෝධන තුළට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එමගින් සේවා තත්ත්වයන් වැඩි දියුණු වී ඇත. දේශපාලනික සහභාගිත්වයට කාන්තාවන්ගේ උනන්දුවේ කැපී පෙනෙන වැඩිවීමක් තිබෙන අතර ඉදිරියේ එළඹෙන පළාත් පාලන මැතිවරණ වලදී තරග කිරීමට බොහෝ දෙනෙකු දැඩි කැමැත්ත ප්‍රකාශ කර ඇති කාන්තාවන් ප්‍රාදේශීය කමිටු රැස්වීම් වල සක්‍රියව නිරතව සිටින අතර සුබසාධන

ප්‍රතිලාභ හා සබැඳි අභියාචනා කමිටුවල සහ කාන්තාවන් හා ළමුන් හා සබැඳි ගැටළු වලට ප්‍රතිචාර දක්වන සංසදවල සාමාජිකාවන්ව සිටින්නේ ඔවුන්ගේ වර්ධනය වන බලය සහ බලපෑම පෙන්නුම් කරමිනි.

දිස්ත්‍රික් සහ පළාත් මට්ටම් වලදී, කාන්තාවන්ට ලබා ගත හැකි සේවාවන්හි වැඩි වීමක් ඇත. කාන්තා සංසද සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව වැඩ කරන සංසද වැනි ජාල කාන්තාවන්ගේ සම්පත් බෙදා ගැනීම, සිද්ධි කළමනාකරණය සහ සේවා සපයන්නන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කර තිබේ. උද්දේශන ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස ආබාධිතත්ත්ව සහිතව දිවි ගෙවන පුද්ගලයන් කෙරෙහි අවධානය යොමු කරමින් පළාත් මට්ටමේ රජයේ ආයතන තුළ ආබාධිකත්ව සහිත කාන්තාවන්ට වඩා හොඳ ප්‍රවේශය සහතික කරමින් ප්‍රවේශ හැකියා ප්‍රමිතීන්ට අනුකූලවීම අනිවාර්ය කරන චක්‍රලේඛයක් ප්‍රකාශයට පත් කිරීම සහ තේ වතුවල මෙන්ම වෙනත් ස්ථාන වලත් සේවිකාවන්ගේ ගැටළු සොයා බැලීමට වෙන්වූ කාර්යාංශයක් ස්ථාපනය කිරීම වැනි ආයතනික වෙනස්කම් සිදුව ඇති රජයේ නිලධාරීන් හා සාකච්ඡා සහ කරුණු දැක්වීම්, දිස්ත්‍රික් සහ පළාත් මට්ටම් වලදී කාන්තාවන් වෙනුවෙන් තීරණාත්මක සබඳතා නිර්මාණය කරමින් ඔවුන් පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වලට වැඩියෙන් සහභාගි වීමට මග පාදා තිබේ.

ජාතික මට්ටමේදී, කාන්තා අයිතිවාසිකම් සංවිධාන ප්‍රතිපත්ති සහ නීති ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්ට සක්‍රියව දායක වී ඇත. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය යටතේ, කාන්තා අයිතිවාසිකම් සංවිධාන ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කළහ. ඉඩම් ප්‍රතිසංස්කරණ පිළිබඳව ජාතික දළ සටහනක්ද සකස් කළ කාන්තා අයිතිවාසිකම් සංවිධාන ශ්‍රී ලංකාව තුළ වියපත්වන ජනගහනයේ කාන්තාකරණය පිළිබඳව පර්යේෂණ අධ්‍යයනයක් දියත් කර ප්‍රතිපත්ති සම්පාදකයන් සහ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ඒ සම්බන්ධයෙන් නිර්දේශ සහිත ප්‍රතිපත්ති දළ සටහනක් සකස් කළහ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2019 වසරේ ප්‍රචණ්ඩත්වය සහ අඩන්තේට්ටම් කිරීම පිළිබඳ 190 වැනි ප්‍රඥප්තිය අපරානුමත කිරීම වෙනුවෙන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස් ආකාරයෙන් සලකන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට සංශෝධන වෙනුවෙන් සාකච්ඡා සඳහා මුලපිරීම්වලට දායක වූ බොහෝ කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ආබාධිතත්ත්ව සහිත කාන්තාවන් වෙනුවෙන් ජාතික සභාවක් පිහිටුවීම වෙනුවෙන් බලපෑම් කළහ. සිව් වසරක් තුළ ඔවුන්ගේ වැඩ සමාලෝචනය කරමින්, සන්දර්භමය සහ සමාජමය අභියෝග තිබියදීත් ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරය කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව කරා කැපී පෙනෙන දායකත්වයන් ලබා දී ඇති බව කාන්තා අයිතිවාසිකම් සංවිධාන අවබෝධ කර ගත්හ.

## කාන්තාවන්ගේ හඬ නියෝජනය සහ සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘති හරහා කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් ඉටු කරන ලද වැඩවලට පාදක වූ ප්‍රධාන ස්ත්‍රීවාදී මූලධර්ම ලෙස හඬ, නියෝජනය සහ සවිබල ගැන්වීම ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතිය හඳුනා ගත්තේය.

කාන්තාවන්ගේ හඬ, නියෝජනය සහ සවිබල ගැන්වීම වැඩි කිරීමේදී ප්‍රජා බලමුළු ගැන්වීම සතු කාර්ය භාරය විමසා බලන කාන්තා සංවිධාන පැහැදිලි කරන්නේ කාන්තාවන් කොන් කරනු ලැබීම සහ වෙනස් ආකාරයෙන් සලකනු ලැබීම සීමිත දැනුවත්බව සහ සංචරණ සීමා අත්විඳින බවත් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ සක්‍රියවීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා ප්‍රකාශ කිරීමට නිරතුරුව අරගලයේ යෙදෙන බවත්ය. ඔවුන්ගේ හඬ වඩාත් ප්‍රබල කිරීම පිණිස කාන්තා සංවිධාන ස්වයං උපකාර කණ්ඩායම්, කාන්තා සමිති ග්‍රාමීය කමිටු ආකාරයෙන් ප්‍රජාවන් තුළ කාන්තා කණ්ඩායම් බලමුළු ගැන්වූයේ එම කණ්ඩායම් අතරින් ඇතැම් ඒවා ප්‍රජා පාදක සංවිධාන ලෙස විධිමත් ආකාරයෙන් පිහිටුවීම පවා සිදු කරමිනි. එකිනෙකා සමඟ සම්බන්ධ වීමට, කණස්සල්ල දනවන

කරුණු බෙදා ගැනීමට, ඔවුන්ගේ අවශ්‍යතා ප්‍රකාශ කිරීමට සහ එකමුතුව පිළිබඳ හැඟීමක් වර්ධනය කර ගැනීමට වේදිකාවක් මෙය ස්ථාපනය කළේය. ඔවුන්ගේ හඬ ප්‍රබල කිරීම සඳහා අවකාශය තවදුරටත් පුළුල් කරමින් වෙනත් ප්‍රජා පාර්ශ්ව කරුවන් සමඟ ජාලගත වීමට මෙම කණ්ඩායම් කාන්තාවන්ට හැකියාව ලබා දුන්නේය.

ප්‍රජා කණ්ඩායම් සකස් කිරීමේ උපායමාර්ගය කාන්තාවන්ට ඔවුන්ගේ නියෝජනය තහවුරු කිරීමේ සාර්ථක මගක් ලෙස පුළුල්ව සලකනු ලැබේ. මෙම ප්‍රජා කණ්ඩායම් තුළ වෙනස් කාන්තා කණ්ඩායම්වල සීමිත නියෝජනය කොන් කරනු ලැබීම අත්විඳින්නන්ගේ නියෝජනයට බාධා පමුණුවන බව හඳුනාගනිමින්, කොන් කරනු ලැබීම අත් විඳි කාන්තාවන් මෙම ප්‍රජා කණ්ඩායම් තුළට ප්‍රවාහගත කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධාන 'ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සහ සමාජ අන්තර්කරණය' යන ප්‍රවේශය යොදා ගනිමින් ඔවුන්ගේ සම කණ්ඩායම් හා සමානවම නියෝජනය ක්‍රියාවේ යෙදවීමට ඔවුනට අවස්ථා වැඩි දියුණු කළහ.

මූල්‍ය සම්පත් කරා ප්‍රවේශය සහ ඒවා මත පාලනය සැපයීමෙන්, මූල්‍ය ස්වාධීනත්වය සහ ඉතුරුම්, ආයෝජන සහ ව්‍යාපාර සංවර්ධනය පිළිබඳව තීරණ ගැනීමේ බලය පෝෂණය කරමින් කාන්තාවන් සවිබල ගැන්වීමේදී ප්‍රජා කණ්ඩායම් තීරණාත්මක කාරයභාරයක් ඉටු කර ඇත. පුහුණුව සහ කුසලතා සංවර්ධනය වෙනුවෙන් අඛණ්ඩ අවස්ථා මෙම කණ්ඩායම් කාන්තාවන්ට ලබා දෙයි. මෙලෙස කාන්තාවන්ට බිම් මට්ටමේ උද්දේශනයේ නිරත වී ඔවුන්ගේ ප්‍රජාව තුළ ගැටළුවලට එරෙහිව සාමූහික ක්‍රියාමාර්ග ගැනීමට කන්තාවන්ට හැකි වේ. සාමාජිකාවන් මෙන්ම අනෙකුත් ප්‍රජා සාමාජිකයන් රජයේ සේවාවන් සහ සහාය සමඟ සම්බන්ධ කරමින් මෙම ප්‍රජා කණ්ඩායම් අත්‍යවශ්‍ය සම්බන්ධකයක් ලෙස ක්‍රියා කරයි. ඔවුන්ගේ අභිලාෂයන් සහ ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා වෙහෙසීමට වැඩි ආත්ම අභිමානය සහ විශ්වාසය තිබෙන බවට බොහෝ දෙනෙකු වාර්තා කරන තත්ත්වයක් තුළ කාන්තාවන්ගේ ස්වයං සවිබල ගැන්වීම කෙරෙහි කාන්තා කණ්ඩායම්වල බලපෑම සැලකිය යුතු මට්ටමක පවතී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ වින්දිතභාවයට පත් වූ කාන්තාවන්ගේ හඬ, නියෝජනය සහ සවිබල ගැන්වීම වැඩි කිරීමට වැඩ කරන කාන්තා සංවිධාන පැහැදිලි කරන්නේ සංවේදීබව නොමැති වීම, සමාජය වෙතින් ආපසු ඔවුනටම ප්‍රහාර එල්ලවීම පිළිබඳ බිය සහ තමන්ටම වරද පටවා ගැනීම ඇතුළුව විවිධ සාධක නිසා කාන්තාවන් සහ ගැහැණු ළමුන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව අත්දැකීම් ප්‍රකාශ කිරීමට පසුබට වන බවත් මෙම අභියෝග වලට විසඳුම් සැපයීම පිණිස කාන්තා අයිතිවාසිකම් සංවිධාන උපායමාර්ග ගණනාවක් යොදා ගත් බවත්ය. බොහෝ දෙනෙකු වෙනත් සේවා සපයන්නන් හෝ නීතිය ක්‍රියාවේ යොදවන්නන් වෙත ප්‍රවේශ වීමට අකමැති බැවින් තමන් මුහුණ දුන් ප්‍රචණ්ඩත්ව සාකච්ඡා කිරීමට කාන්තාවන්ට ආරක්ෂා සහිත මගක් සපයමින් කාන්තා අයිතිවාසිකම් සංවිධානම ඒවා හරහා සේවා ලබා දීම මෙයට ඇතුළත් විය. පෙරට විත් තම අත්දැකීම් බෙදා ගැනීමට තැනැත්තන් දිරි ගැන්වීමේදී ප්‍රජා කණ්ඩායම් පිහිටුවීම ද ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කළේය. මෙම කණ්ඩායම්, මෙම ගැටළු වලට මුහුණ දීමේදී වින්දිතයන් තනි වී නොමැති බවට සහන දායක හැඟීම වින්දිතයන් තුළ ඇති කර ඒවාට විසඳුම් සැපයීමට විශ්වාසය වර්ධනය කළහ. එයට අමතරව පාර්ශ්ව කරුවන් සහ පොදු ජනතාව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව දැනුවත් කිරීම පිණිස කාන්තාවන් සවිබල ගැන්වීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන රජය විසින් මෙහෙයවනු ලබන විධිමත් වේදිකා සහ සමාජ මාධ්‍ය වැනි වෙනත් විවිධ වේදිකා භාවිතා කළහ.

ප්‍රජාව තුළ සිටින ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ වින්දිත දිවි ගලවා ගත් කාන්තාවන් ඔවුන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔවුන්ට අවශ්‍ය ආකාරය පිළිබඳව තීරණ ගැනීමේදී ඉහළ නියෝජනයක් පෙන්නුම් කරන බව කාන්තා අයිතිවාසිකම් සංවිධාන නිරීක්ෂණය කළහ. ඔවුහු ප්‍රජා නායිකාවන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සේවා සපයන්නන් වෙතින් සහාය පතන අතර මෙය නියෝජනයේ වැඩි වීමක් පිළිබිඹු කරයි.

විශේෂයෙන්ම කාන්තාවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම පිණිස කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් මෙහෙයවන ලද විවිධ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස වැඩි වූ මූල්‍ය ස්වාධීනත්වය අනුව වින්දිත දිවි ගලවා ගත් කාන්තාවන් අතර සවිබල ගැන්වීමේ වර්ධනයක් කාන්තා අයිතිවාසිකම් සංවිධාන නිරීක්ෂණය කළහ. ප්‍රජා කණ්ඩායම් හරහා වැඩි ප්‍රජා සහාය මගින් මෙම සවිබල ගැන්වීම තවදුරටත් වැඩි දියුණු කරනු ලැබේ. ඒ අනුව, ඔවුන්ම සහ ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් ප්‍රචණ්ඩත්වයෙන් තොර පරිසරයක් නිර්මාණය කිරීම මගින් අපරාධකරුවන් මත ඔවුන්ගේ යැපීම අඩු කර ඔවුන්ගේ ජීවිතවල පාලනය සියතට ගැනීමට කාන්තාවන් විශ්වාසය අත් කරගත් අවස්ථා රැසක් කාන්තා අයිතිවාසිකම් සංවිධාන නිරීක්ෂණය කරයි.

කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය සහ නායතක්වය වැඩි දියුණු කිරීමට කාන්තාවන්ගේ හඬ, නියෝජනය සහ සවිබල ගැන්වීම වර්ධනය කරමින් කාන්තා සංවිධාන නිරීක්ෂණය කරන්නේ කාන්තාවන් මුහුණ දෙන විවිධ අභියෝග රැසක් පිළිබඳ දැනුවත්බව නොමැති වීමට හේතු වෙමින් කාන්තාවන්ගේ හඬෙහි ඌන නියෝජනයක් දේශපාලනය තුළ පවතින බවයි. ඔවුන්ගේ මන්ත්‍රීවරියන්ගේ සත්‍ය නියෝජනය සහතික කිරීම පිණිස ඔවුන්ගේ දේශපාලන න්‍යායපත්‍ර තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීම සඳහා දේශපාලනයට පිවිසීමට අපේක්ෂා කරන කාන්තාවන්, ප්‍රජා නායකයන් සහ රජයේ නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණ ඇතිව කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන් වෙනුවෙන් පුහුණු, දැනුවත් කිරීමේ සහ සංවේදීකරණ වැඩසටහන් මෙහෙයවූහ. කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තාවන්ගේ හඬෙහි වර්ධනය වන බලපෑම හුවා දක්වමින් විරෝධතා වැනි දේශපාලන ක්‍රියාමාර්ගවල ඔවුන්ගේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා කාන්තාවන් දැනුවත් කිරීමේ සහ බලමුළු ගැන්වීමේ ක්‍රියාවලියේ සක්‍රියව නිරත වූහ.

පළාත් පාලන ක්‍රියාවලි, වගකීම් සහ කාන්තාවට ලබා ගත හැකි රජයේ සේවා පිළිබඳව කාන්තාවන්ගේ අවබෝධය වැඩිදියුණු කිරීම වෙනුවෙන් කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කළහ. නායකත්ව කුසලතා වර්ධනය සහ ප්‍රජා අවශ්‍යතා හඳුනාගැනීම, යෝජනා ලිවීම අරමුදල් රැස් කිරීම සහ අයවැය සකස් කිරීම ඇතුළුව සඵලදායක දේශපාලන නායකත්වය වෙනුවෙන් අවශ්‍ය කුසලතා සහ අනෙකුත් අත්‍යවශ්‍ය නිපුණතා වර්ධනය සම්බන්ධ පුහුණුවද ඔවුහු සිය දේශපාලන සහභාගිත්වය වැඩි කිරීමට අපේක්ෂා කරන කාන්තාවන්ට සැපයූහ. එහි ප්‍රතිඵලයක් ලෙස දේශපාලන පක්ෂවලට බැඳීම වැනි ආකාර වලින් කාන්තාවන් තම මැදිහත්වීම වැඩි කිරීම තුළින් ඔවුන්ගේ නියෝජනයේ පැහැදිලි වැඩි වීමක් තිබේ.

බොහෝ කාන්තාවන් සාම්ප්‍රදායික වශයෙන් පුරුෂ ආධිපත්‍යයට නතුව තිබූ ව්‍යුහයන් තුළ පවා තීරණ ගැනීමේ භූමිකා භාරගෙන සිටින අතර ඇතැම් කාන්තාවන් කාන්තා නායකත්ව බලය තහවුරු කිරීමට අවකාශය නිර්මාණය කර තිබේ. උදාහරණයක් ලෙස, දේශපාලනයට සහභාගි වීමට කාන්තාවන් අතර වර්ධනය වන උනන්දුවක් ඇති අතර බොහෝ දෙනෙකු ඉදිරියේ එළඹෙන මැතිවරණ වලදී තරග කිරීමට අපේක්ෂාවෙන් සිටී කාන්තාවන්ගේ කම්කරු හිමිකම් සන්දර්භය තුළ කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය සමිති පිහිටුවා ඇති අතර සේවිකාවන්ගේ කේවල් කිරීමේ බලය වැඩි දියුණු කිරීමට කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය සමිති සම්මේලනයක් සකස් කිරීම කරා කටයුතු කරමින් සිටිති. එයට අමතරව ඇතැම් කාන්තාවන් විවිධ ජාල සහ සන්ධාන තුළ තනතුරු භාර ගෙන සිටී. මෙම සාම්ප්‍රදායිකව පුරුෂ ආධිපත්‍යයට නතු ව තිබූ අවකාශ තුළ කාන්තාවන්ගේ දේශපාලනික සවිබල ගැන්වීමේ නායකත්වයේ සහ බලපෑමේ වර්ධනයක් මෙම තත්ත්වයන් පෙන්නුම් කරයි.

උපායමාර්ගික ප්‍රවේශයක් ලෙස, කාන්තා අයිතිවාසිකම් සංවිධාන ප්‍රජා කණ්ඩායම් සහ රජයේ නිලධාරීන් අතර ජාල සහ සබඳතා ගොඩ නගා ඇත. මෙම ප්‍රජා කණ්ඩායම්වල සිටින කාන්තාවන් ප්‍රජා ගැටළු කෙරෙහි අවධානය යොමු කර ඒවා විසඳීමට  රජයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවන් වල නිරත වීම පිණිස මෙම සම්බන්ධතා වල වාසිය ලබා ගන්නේ වැඩි වූ නියෝජනය සහ සවිබල ගැන්වීම පැහැදිලිව ප්‍රකට කරමිනි. ඔවුන්ගේ සවිබල ගැන්වීම රජයේ නිලධාරීන්ට වඩාත් පැහැදිලිව පෙනෙන තත්ත්වයට පත්ව ඇති අතර එය එම නිලධාරීන් තුළ කාන්තාවන් පිළිබඳ ආකල්ප සහ ප්‍රත්‍යක්ෂයන්හි වෙනසකට මග පාදා තිබේ.

කාන්තාවන් සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ගේ ධනාත්මක ආකල්ප සහ ප්‍රත්‍යක්ෂයන්ට දායක වන තවත් සාධකයක් වන්නේ කාන්තා අයිතිවාසිකම් සංවිධාන යොදාගනු ලබන ද්විත්ව ප්‍රවේශයයි. කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තාවන් වෙනුවෙන් විවිධ මාතෘකා ගණනාවක් පිළිබඳව පවත්වන ලද දැනුවත් කිරීම් සහ පුහුණු සැසි වලදී සම්පත් දායකයන් ලෙසද රජයේ නිලධාරීන්ව සක්‍රිය ලෙස සම්බන්ධ කර ගන්නා අතරම ඔවුහු එම නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරණ වැඩසටහන් මෙහෙයවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රජයේ නිලධාරීන් කාන්තාවන්ව රැස්වීම් වලට ඇතුළත් කර ගැනීම සහ ප්‍රජා ගැටළු වලට විසඳුම් සැපයීමේදී සක්‍රිය ලෙස ඔවුන්ගේ සහාය පැතීම අරඹා තිබේ. ප්‍රජාව තුළ රජයේ නිලධාරීන්ගේ සේවා ව්‍යාප්තිය සහ නිරතවීමට අදාලව කාන්තා නායකත්වය සහ දේශපාලනික සවිබල ගැන්වීම ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කර තිබෙන බව කාන්තා අයිතිවාසිකම් සංවිධාන නිරීක්ෂණය කළහ.

කාන්තාවන් තමන් කැමති ආදායම් උත්පාදන ක්‍රම හා සබැඳිව තීරණ ගන්නා විට ඔවුන් මුහුණ දෙන අභියෝග හඳුනා ගනිමින් කාන්තා අයිතිවාසිකම් සංවිධාන කුසලතා වර්ධනය, මූල්‍ය සේවා සහ අනෙකුත් සම්පත් කරා ප්‍රවේශය සහතික කිරීම සහ රජයේ නිලධාරීන් සමඟ සබඳතා සහ වෙළඳපොළවල් කරා ප්‍රවේශය හරහා කාන්තාවන්ගේ ආර්ථික නියෝජනය වැඩිදියුණු කිරීමට පියවර ගත්හ. කාන්තා අයිතිවාසිකම් සංවිධාන වල ප්‍රයත්නයන්, වඩා ඉහළ ආදායම්, ඉතුරුම් සහ ආයෝජන සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වැඩි බලය සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් පුළුල් කිරීම හා සබැඳි තේරීම් වලදී වැඩි ස්වායත්තතාවට මග පාදා තිබේ. ඇතැම් ස්වයං උපකාර කණ්ඩායම් වල ව්‍යුහයද මූල්‍ය සම්පත් මත කාන්තාවන්ගේ පාලනය වැඩිදියුණු කර ඇත. ස්වයං උපකාර කණ්ඩායම් මට්ටමේදී කාන්තාවන්ට සැපයෙන ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රම මෙම සම්පත් ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනයට හා පෞද්ගලික අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට වෙන් කිරීමට ඔවුන්ට වැඩි අවස්ථා ලබා දෙමින් මූල්‍ය සම්පත් මත යම් මට්ටමක පාලනයක් ඔවුනට ලබා දී ඇත. මෙය වැඩිදියුණු වූ නියෝජනයේ සහ ආර්ථික සවිබල ගැන්වීමේ පිළිබිඹුවකි.

කාන්තා අයිතිවාසිකම් සංවිධාන සේවිකාවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නෛතික පටිපාටි පිළිබඳව දැනුම සැපයීම මගින් සේවිකාවන්ගේ වැඩිදියුණු වූ ආර්ථික නියෝජනයට සහ සවිබල ගැන්වීමට දායක වූහ. ඔවුන් නීතිමය සහාය ලබා දීමටද ඉදිරිපත් වූ අතර කම්කරු දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධතා වෙනුවෙන් පහසුකම් සැලසූහ. පෙරදී. ඔවුන්ගේ ආර්ථික අවස්ථා ප්‍රතිඵල ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව සීමා කළ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් කාන්තාවන් ඍජුවම අභියෝගයට ලක් කරන බැවින් වන්දි සහ ප්‍රතිලාභ වලට හිමිකම් පෑමෙන් ඔවුන්ගේ ආර්ථික අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට ඔවුන් සතු හැකියාව වැඩිදියුණු කිරීමේ මෙම ප්‍රයත්න සවිබල ගැන්වීමේ මට්ටමක් පිළිබිඹු කරයි. බොහෝ විට නීතියට අනුකූල නොවන ආකාරයට පෞද්ගලික හිමිකාරිත්වය සහිත කම්හල් රැසක් වසා දැමෙමින් පැවති ආර්ථික අර්බුදයේ සන්දර්භය තුළ මෙය විශේෂයෙන්ම තීරණාත්මක විය.

## කාන්තා අයිතිවාසිකම් සංවිධානවල වැඩට සහාය වීමේ ප්‍රතිඵලයක් ලෙස නිවෙස තුළ කාන්තාවන්ගේ හඬ වර්ධනය වීම, නියෝජනය සහ සවිබල ගැන්වීම ඇති කළ ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය දුටුවේය

කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඔවුන්ගේ වැඩ තුළ පිරිමින් සහ පිරිමි ළමුන් සම්බන්ධ කර ගැනීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන උපායමාර්ගික මැදිහත් වීම් භාවිතා කර තිබේ. කාන්තාවන්ගේ හඬ, නියෝජනය සහ සවිබල ගැන්වීම වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයන් පිරිමින් සහ පිරිමි ළමුන් නිරත කරගැනීම හා සමඟ සිදුවිය යුතු බව හඳුනාගනිමින්, කාන්තා අයිතිවාසිකම් සංවිධාන ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව, කාන්තා අයිතිවාසිකම්,සවිබල ගැන්වීම සහ මිත්‍රපක්ෂ ලෙස පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ භූමිකාව වැනි මාතෘකා ආවරණය කරමින් දැනුවත් කිරීමේ සහ සංවේදී කිරීමේ වැඩසටහන් මෙහෙයවීම මෙන්ම තොරතුරු පත්‍රිකා ආදිය බෙදා දීමද සිදු කළහ.

නිවස තුළ සහ ඉන් පිටත යන දෙආකාරයෙන්ම කාන්තාවන් ඉටු කරන කාර්යයන් පිළිබඳව වඩාත් ගැඹුරු ඇගයීමක් පෝෂණය කිරීම පිණිස, එකමුතුබව පෝෂණය කිරීම සහ සහායක කාර්ය භාරයක් ඉටු කිරීම සඳහා පවුල් පෙළඹවීමට කාන්තා අයිතිවාසිකම් සංවිධාන කාන්තාවන් සහ ඔවුන්ගේ ජයග්‍රහණ සමරන අවස්ථාවන්ට පවුල් සම්බන්ධ කර ගත්හ. තවද, සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා වලට අභියෝග කිරීමට සහ වගකීම් බෙදාගැනීම ප්‍රවර්ධනය කිරීමට, කාන්තා අයිතිවාසිකම් සංවිධාන පිරිමින් සහ පිරිමි ළමුන් විශේෂිත පුහුණු සහ කුසලතා වර්ධන වැඩසටහන් වලට ඇතුළත් කර ගත්හ. උදාහරණයක් ලෙස, ගෙවතු වගාව සහ කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව වැනි ආහාර සුරක්ෂිතාව වැඩිදියුණු කිරීමේ අරමුණ සහිත වැඩසටහන් වලට කාන්තා අයිතිවාසිකම් සංවිධාන එකම කුටුම්බය වෙතින් පිරිමින් සහ පිරිමි ළමුන්ද ඇතුළත් කරගත්තේ පවුලක ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් වගකීම සම්පූර්ණයෙන්ම කාන්තාවන්ට පැවරීම සිදු නොවන බව සහතික කිරීම සඳහාය.

මෙම මැදිහත් වීම්වල ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ කුටුම්බ තුළ වැඩි සාකච්ඡා කිරීමේ සහ තීරණ ගැනීමේ බලය සහිතව, නිවස තුළ ඔවුන්ගේ දායකත්වයන් දැකීම, පිළිගැනීම සහ ඒවාට ගෞරවය කැපී පෙනෙන ලෙස වැඩිවීමක් අත්දුටු බව ප්‍රතිලාභී කාන්තාවෝ ප්‍රකාශ කරති. දැන් ඔවුන්ට කුටුම්බයේ මුදල් සහ වියදම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ වැඩි බලයක් තිබෙන අතර ඔවුන්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය තේරීම් මත පාලනය ක්‍රියාවේ යොදවමින් වැඩි සංචරණ නිදහස භුක්ති විඳිති. ඇතැම් අවස්ථාවලදී, ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් අඩු වී ඇත්තේ වැඩිදියුණු වූ පවුල් ජීවිතයකට මග පාදමිනි. කාන්තාවන් කුටුම්බයේ වගකීම් බෙදාගනිමින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වන බැවින් ඔවුන් වඩාත් සවිබල ගන්වනු ලැබ සිටින බව නිරීක්ෂණය කරනු ලැබේ.

කාන්තාවන්ගේ නියෝජනය සහ ඔවුන්ගේ සවිබල ගැන්වීමට මග පාදන කාන්තාවන්ගේ හඬ සහතික කිරීමේ විවිධ ක්‍රම පිළිබඳව කාන්තා අයිතිවාසිකම් සංවිධාන කථා කරයි. ප්‍රජාව තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රාදේශීය බලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, සේවකයන්,සේවා සපයන්නන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සමඟ පවා සාකච්ඡා කිරීම, බලපෑම් කිරීම සහ උද්දේශනය  පිණිස සාමූහික හඬක් වෙනුවෙන් කාන්තා කණ්ඩායම් සකස් කිරීම; ප්‍රචණ්ඩත්ව තත්ත්ව සම්බන්ධයෙන් ඉදිරියට ඒමට වැඩි වැඩියෙන් කාන්තාවන් දිරි ගැන්වීම සහ දැනුවත් කිරීමේ පුහුණුපැවැත්වීම, බලපෑමට ලක් වූ කාන්තාවන් සහ ළමුන් ආරක්ෂණ සේවා සමඟ සම්බන්ධ කිරීම සහ අවිවාහක/වැන්දඹු කාන්තාවන්ට උපන් දරුවන් වෙනුවෙන් උප්පැන්න සහතික ලබා ගැනීමෙන් පවා සමාජයේ ඔවුන්ගේ තැන නැවත අත් කර ගැනීමට ඔවුන්ව සවිබල ගැන්වීම; කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය පිළිබඳව පුහුණු පැවැත්වීම සහ පළාත් සභා ක්‍රියාකාරකම්වලට සහභාගි වන කාන්තාවන් සංඛ්‍යාව වැඩි කිරීම; අර්ධ විධිමත් අංශ අවිධිමත් අංශය තුළ වැඩ කරන කාන්තාවන්ගේ සහ ලිංගික ශ්‍රමිකයන් වැනි නොපිළිගත් වෘත්තීන්හි යෙදෙන්නියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමට කාන්තාවන් ශක්තිමත් කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සහ යුද්ධයේ සහ ජාතිවාදී ප්‍රචණ්ඩත්වයේ අහිතකර බලපෑමට ලක් වූවන්ගේ පවුල් වලට හඬක් ලබා දීම; කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සහ වන්දි ලබා දීම;  ආහාර සුරක්ෂිතතාව හා සබැඳි අවදානම් තත්ත්වයන්ට සඵලදායක ලෙස මුහුණ දීම සහ ආදායම කරා ප්‍රවේශය සහ විය මත පාලනය; ලිංගික සුළුතර කාන්තාවන්ගේ සමානාත්මතාව වෙනුවෙන් සටන් කිරීම සහ නීතිය ක්‍රියාවේ යොදවන්නන් ඔවුන්ගේ ප්‍රජා තුළ කරන ලද නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්වලට එරෙහිව උපදේශනය  පවා මේවාට ඇතුළත් වේ.

කාන්තාවන්ගේ හඬ වඩාත් ප්‍රබල කිරීමේදී සාමූහික හඬක් යන අදහස ප්‍රධාන අංගයක් ලෙස මතු විය. කාන්තාවන්ට එකමුතුබව ඇතිකිරීමට පමණක් නොව සාමූහික හඬක බලය අවධාරණය කිරීමට බොහෝ කාන්තා අයිතිවාසිකම් සංවිධාන කණ්ඩායම් සහ සංසද සකස් කිරීමට වැඩි වැදගත්කමක් දුන්හ. බිම් මට්ටමේ කාන්තාවන්ගේ හඬ අසනු ලැබීමට වැඩි ඉඩක් පවතින බලධාරීන් සහ සේවා සපයන්නන් සමඟ කාන්තාවන් සම්බන්ධ කිරීමේ උපායමාර්ගයක්

ලෙස ජාලගත කිරීම බොහෝ විට යොදා ගැනිණි. කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය කාන්තාවන්ගේ අවශ්‍යතා, උවමනාවන් සහ අභිලාෂයන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය නියෝජනය සහ බලය නිර්මාණය කරනු ඇති බැවින් කාන්තාවන්ගේ හඬ වඩාත් ප්‍රබලව ඇසෙන්නට සැලැස්වීමේදී එයද තීරණාත්මක ලෙස දකින ලදී.

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ හවුල්කරුවන්ට සවිබල ගැන්වීම යනු කුසලතා වැඩි දියුණු කිරීම, කාන්තාවකට ඇයගේ හැකියා සහ විභවය පිළිබඳ ස්වයං අවබෝධය සහ ආත්ම අභිමානය සහ අවසාන වශයෙන් ඇයගේ ආත්ම විශ්වාසය වර්ධනය සිදු කරන අතරම ඇයගේම න්‍යායපත්‍රයට අනුව ඇයගේ ජීවිතය පාලනය කිරීමට ඇය සතු බලය වේ. පුද්ගලයන්ට හෝ ආයතනවලට තමන් සවිබල ගන්වා ගැනීමට උපකාර කිරීමට බාහිර පාර්ශ්වයන්ට හැකියාව තිබෙන අතර පුද්ගලයෙකුට තනිවම තමන්ව සවිබල ගන්වා ගැනීමේ හැකියාවද පවතී.

සවිබල ගැන්වීම හුදෙක් ක්‍රියාවලියක් පමණක් නොව නිවස සේවා ස්ථානය සහ සමාජය යන ජීවිතයේ සියළු අවකාශ තුළ අවසාන ප්‍රතිඵලයක් ලෙස විස්තර කරනු ලැබිණි. දැනුම,කුසලතා, මානව සහ ද්‍රව්‍යමය සම්පත්, ජාල ප්‍රතිපත්ති හා මෙවලම් මෙන්ම අවස්ථා සහ අත්දැකීම් සවිබල ගැන්වීම වෙනුවෙන් තීරණාත්මක සාධක ලෙස හඳුනාගන්නා ලද අතර මේවා නොමැති කම බොහෝ විට 'බලය නොමැති වීමකට මග පාදන බව සාකච්ඡා කරනු ලැබිණි කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් හඳුනා ගන්නා ලද ඉලක්ක කණ්ඩායම් වලට බොහෝ විට ඉහත සාධක අතරින් කවරක් හෝ නොමැති, එබැවින් ඔවුන්ගේ ව්‍යාපෘති පියවීමට උත්සාහ දරන පරතරයක් ප්‍රදර්ශනය කරන කාන්තාවන් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය මගින් තමන් සවිබල ගන්වනු ලැබූ බවත් ඔවුන්ගේ ඇතැම් ව්‍යාපෘති වල ප්‍රතිලාභීන් දැන් සම්පත් දායකයන් බවට පත්ව ප්‍රචණ්ඩත්ව සහ වෙනස් ආකාරයෙන් සලකනු ලැබීමේ තත්ත්වයන් සමඟ කටයුතු කිරීමට හා ඔවුනට අවශ්‍ය සහාය ලබා ගැනීමට නව පරම්පරාවක් සවිබල ගන්වමින් සිටින බවත් හවුල්කරුවෝ ප්‍රකාශ කරති.

කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට, කොන් කිරීම සහ වෙනස් ආකාරයෙන් සැලකීම හඳුනා ගැනීම සහ පිළිගැනීම, සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සහතික කිරීම සඳහා ස්ත්‍රීවාදී ප්‍රවේශ හඳුනා ගැනීමට සහ පිළිගැනීමට මග පාදයි. කාන්තාවන් කොන් කිරීම සහ වෙනස් ආකාරයෙන් සැලකීම, කාන්තාවන් විසින් විවිධ තත්ත්වයන් තුළ (වාර්ගිකත්වය, ආගම, ආර්ථික තත්ත්වය, පදිංචි ස්ථානය, ලිංගික දිශානතිය, වෘත්තිය සහ තවත් සාධක බොහෝ ගණනක් හේතුවෙන්) වෙනස් ආකාරයෙන් මුහුණ දෙනු ලබන බහු මාන ගැටළුවක් ලෙස  ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ හවුල්කරුවන් විසින් අවබෝධ කරගනු ලැබේ. එනමුත් හවුල්කරුවන් පවසන්නේ එම අත්දැකීම කාන්තාවන්ට අනන්‍ය වුවත්, පොදුවේ සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව සහ විශේෂයෙන්ම විවිධ කණ්ඩායම් සහ ප්‍රජාවන් බැහැර කිරීමට හේතුවන ප්‍රතිඵලය එකම බවයි.

කාන්තා අයිතිවාසිකම් සංවිධාන කරන වැඩ තුළ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත් විඳින කාන්තාවන් සේවාවන් කරා ප්‍රවේශය නොමැතිව කොන් කරනු ලැබීම රාජ්‍යය විසින් සේවා සැපයීමේදී ගෘහ මූලික කාන්තාවන් සිටින කුටුම්බවලට සහ ආබාධිතත්ත්ව සහිතව දිවි ගෙවන කාන්තාවන්ට ප්‍රමුඛතාව නොලැබීම තේ වතුවල ජීවත්වන සහ වැඩ කරන කාන්තාවන්ට දේශපාලන පක්ෂ සහ සේවක සංගම් තුළ තැනක් නොලැබීම සහ නිවාස සහ ඉඩම් අයිතිවාසිකම් අහිමි කරනු ලැබීම, බිම් මට්ටමේ ප්‍රජාවන් තුළ සිටින කාන්තාවන් දේශපාලන ක්‍රියාවලි වලට ඇතුළත් කර නොගැනීම, ග්‍රාමීය පාසල්වල ගැහැණු ළමුන්ට ක්‍රීඩා වලට සහභාගි වීමට අවසර නොලැබීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන්වලට ඇබ්බැහි වූ කාන්තාවන් ප්‍රජා ක්‍රියාකාරකම් වලින් කොන් කරනු ලැබීම, යුද්ධය සහ ස්වාභාවික ආපදා හේතුවෙන් අවතැන් වූ කාන්තාවන්ට අධ්‍යාපනය සහ ප්‍රජා ක්‍රියාකාරකම්වලට ප්‍රවේශය නොමැති වීම, ලිංගික ශ්‍රමික වැනි තහනම් රැකියාවල නියුතු කාන්තාවන්ට සමාජ ආරක්ෂණය නොමැති වීම සහ කුඩා කාන්තා කණ්ඩායම් විසින් අත් දකිනු ලබන තවත් නිමක් නොමැති ගැටළු සංඛ්‍යාවක් ඔවුහු දකිති. මෙය සියළු කාන්තාවන්

පොදුවේ බල රහිත කිරීමට දායක වන බැවින් මෙය සියළු කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන ගැටළුවක් ලෙස කාන්තා සංවිධාන විසින් පිළිගනු ලැබේ.

කාන්තා සංවිධාන කාන්තාවන්ගේ සමානාත්මතාව කරා වැඩ කිරීමට මැදිහත්වීම් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමේදී වෙනස් ආකාරයෙන් සැලකීම සහ කොන් කිරීම අතර මෙම වෙනස අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කළහ. මෙම ක්‍රියාවලිය මූලිකවම ස්ත්‍රීවාදීය.




ඇතැම් සංවිධාන අවබෝධ කරගත් ආකාරයට සවිබල ගැන්වීම කාන්තාවන්ට ඔවුන්ගේ දියුණු වීමේ අභිලාෂයන් ඉටු කර ගැනීමට සහ පාරම්පරික අපකීර්තිය බිඳ දැමීමට හැකියාව ලබා දෙන කාන්තාවන් අතර එය එකමුතුකම පෝෂණය කිරීම වටා පරිභ්‍රමණය විය. තවත් සංවිධාන සවිබල ගැන්වීම කාන්තාවන් වෙනුවෙන් ජයග්‍රහණයක් ලෙස සහ ඔවුන්ගේ ජීවිතවල සියළු අංශ ශක්තිමත් කරන ක්‍රියාවලියක් ලෙස දුටුහ. ඇතැම් සංවිධාන සවිබල ගැන්වීම කාන්තාවක තම හැකියා සහ විභවය පිළිබඳ ස්වයං අවබෝධය වෙනුවෙන් බාධක ජයගැනීමක් ලෙස සැලකූහ.

ඉහත ඡායාරූපය සවිබල ගැන්වීම යන්නෙන් ඔවුනට හැඟවෙන අර්ථය දෘශ්‍යමය අර්ථ දැක්වීමක ආකාරයෙන් කාන්තා අයිවාසිකම් සංවිධානය විසින් අඳින ලද රූපසටහන් එකතුවක් පෙන්නුම් කරයි.

## කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ස්ත්‍රීවාදය යනු කුමක්ද?

කාන්තා අයිතිවාසිකම් සංවිධාන ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ අරමුණ විමසා බලමින් සහ ප්‍රායෝගික සහ උපායමාර්ගික ස්ත්‍රී පුරුෂ සමාජභාව අවශ්‍යතා අතර වෙනස, ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා සහ බල සබඳතා වල බලපෑම සහ කාන්තාවන් වෙනුවෙන් ශක්තිමත් හඬක් නිර්මාණය කිරීම, ඔවුන්ගේ අයිතිවාසිකම් පූර්ණ ලෙස අත්කර ගැනීමට මග පාදන ඔවුන්ගේ නියෝජනය ශක්තිමත් කිරීම, ඔවුන්ගේ සවිබල ගැන්වීම සහ අවසාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සාකච්ඡා කරමින්, ශ්‍රී ලංකාව තුළ සහ දකුණු ආසියානු සන්දර්භය තුළ ස්ත්‍රීවාදී සංකල්පය විවේචනාත්මකව විශ්ලේෂණය කරති.

කාන්තා සංවිධාන ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා සහ වගකීම් හා බල සබඳතා වලට අදාල පක්ෂග්‍රාහීකම් සම්බන්ධයෙන් අන්තරාවලෝකනය, පවුල, ආගම, දේශපාලන නායකයන් සහ ප්‍රජා නායකයන් වැනි බාහිර සාධක සහ බලවේග සහ කාන්තාවන්ම විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා පැවැත්ම තහවුරු කිරීම සහ පීතෘමූලිකත්වය තහවුරු කරන බල සබඳතාවන්හි අසමතුලිතතා බිඳ දැමීමේදී ස්ත්‍රීවාදයේ කාර්ය භාරය සම්බන්ධ කරගන්නා ඔවුන්ගේ වැඩ තුළ ඇතැම් වැදගත් චින්තන ක්‍රියාවලි සාකච්ඡා කරති. මෙම සංවාදය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානාත්මතාව සහ සත්‍යාර්ථ ක්‍රියාමාර්ග පිළිබඳ වගන්ති අතීත සහ වර්තමාන ස්ත්‍රීවාදී ව්‍යාපාර වල අත්දැකීම්, කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කොට සැලකීම තුරන් කිරීමේ ප්‍රඥප්තිය, බීජිං ප්‍රකාශනය, 5 වැනි තිරසාර සංවර්ධන ඉලක්කය සහ 1325 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනා සම්මතය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් මෙහෙයවෙන ජාතික ප්‍රතිපත්ති වැනි මාර්ගෝපදේශක මූලධර්ම ලෙස භාවිතා කිරීමට ශ්‍රී ලංකාවේ තිබෙන ස්ත්‍රීවාදී මෙවලම් සහ සාධනපත්‍ර මත දැඩි ලෙස පදනම් වී තිබේ.

ඔවුන්ගේ මැදිහත්වීම් සුබසාධන සහාය සහ ආරක්ෂාව සපයන බව පිළිගනිමින් කාන්තා සංවිධාන ඔවුන්ගේම කාර්යයන් ප්‍රශ්න කරති. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ සහාය ලැබූ මැදිහත්වීම් ජීවනෝපාය සහාය, ණය සහ ආදායම වැඩි කිරීමේ අවස්ථා කරා ප්‍රවේශය, වෘත්තීය පුහුණුව සහ වෙළඳපොළවල් කරා ප්‍රවේශය, මුදල් කළමනාකරණය පිළිබඳ දැනුම වෙතින් කාන්තාවන් වෙනුවෙන් ආර්ථික ස්ථාවරබව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්බව සහ සේවා සහ යුක්ති යාන්ත්‍රණ කරා ප්‍රවේශය සහ සුබසාධන ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ ක්‍රම කරා වඩා හොඳ ප්‍රවේශය සම්බන්ධයෙනි.

එය අධිකරණ පද්ධතියෙන් ආරක්ෂාව "සේවා, ආහාර සුරක්ෂිතතාව, වෛද්‍ය සහ මනෝසමාජමය සහාය" රැකියාව ආරක්ෂා කිරීම සහ කාන්තාවන් කණ්ඩායම් ලෙස සංවිධානය වී තමන් ආරක්ෂාවීම වේවා ඔවුන්ගේ මැදිහත්වීම් කාන්තාවන්ට ආරක්ෂාව සහ රැකවරණය සපයන බව කාන්තා සංවිධාන දැඩිව ප්‍රකාශ කරති.

සුබසාධන සහ ආරක්ෂක මැදිහත් වීම් ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව, ආරක්ෂණවාදය සහ පීතෘ මූලික අනුග්‍රහය යන ඒකාකෘති තත්ත්වයන්හි උගුලට කාන්තාවන් හසු කරන්නේදැයි කාන්තා සංවිධාන ප්‍රශ්න කරති. මෙම ප්‍රවේශ ඒ ආකාරයෙන්ම ස්ත්‍රීවාදී නොවන බවට එක හඬින් පිළිගන්නා ඔවුහු ඒවා සවිබල ගැන්වීම, කාන්තා අයිතිවාසිකම් අත්කර ගැනීම සහ ශක්තිමත් කිරීම සහ අවසානයේ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව අඩු කිරීමේ හුදු උපක්‍රම බව ප්‍රකාශ කරති.

ප්‍රජාව තුළ කාන්තාවන්ගේ සාමූහික ශක්තිය නිසා ඔවුහු සවිබල ගැන්වෙති; වෙනස් ආකාරයෙන් සලකනු ලැබීමට මගපාදමින් ඔවුන්ව කොන් කරන සහ බැහැර කරන ගැටළු වඩා හොඳින් හඳුනා ගනිමින්, ඔවුන්ගේ විවිධ ප්‍රශ්නවලට විසඳුම් කරා වඩා හොඳ ප්‍රවේශයක් සහ සහ පාලනයක් සහිතව ළඟා වීම; බලධාරී ආයතන තුළ නායකත්ව කාර්යභාර ඉටු කිරීමට සහ වෙනස් ආකාරයෙන් සලකනු ලැබීමට අභියෝග කිරීමට වැඩි වූ බලය (ආගමික, රාජ්‍ය, රාජ්‍ය නොවන සහ කුටුම්බය තුළ), වර්ධනය වූ මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධනය හරහා මැදිහත්වීම් තිරසාර කිරීමේ හැකියාව, ඔවුන්ගේ ප්‍රජාවන් තුළ අභිමානය සහ ඉහළ තත්ත්වය

ළඟා කර දෙමින් ප්‍රජාව වෙතින් ඔවුනට ලැබෙන ගෞරවය, ඔවුන්ගේ ආත්ම අභිමානය, ආත්ම ගෞරවය සහ ආත්ම විශ්වාසය වැඩි වීම.

සිව් වසරක් පුරා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ හඬ සහ නායකත්වය සමඟ හවුලේ කටයුතු කළ කාන්තා අයිතිවාසිකම් සංවිධාන, තමන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කර ඇති බවට විශ්වාසයෙන් පසු වේ. කාන්තාවන්ගේ වැඩි වූ හඬ, දේශපාලනයේ ඇතුළුව ඔවුන්ගේම සංවිධාන වලින් බැහැර නායකත්ව භූමිකාවල සහභාගිත්වය, කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිමින් ඇතුළත් කරගනිමින් මණ්ඩප සහ ජාල පිහිටුවීම, පීතෘමූලික ආයතන තුළ තීරණ ගැනීමේ වැඩි වූ බලය, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය  මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් ලෙස හඳුනාගන්නා සහ ප්‍රතිචාර දක්වන පද්ධති සහතික කිරීම මගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම තුළ ඔවුහු මේ වෙනුවෙන් පැහැදිලි සහ දෘශ්‍ය උදාහරණ සපයති. මේ අනුව ඔවුන්ගේ කාර්යයන්  හරහා අසමානතා අඩු කර ඇති බව හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සංවිධාන දැඩි ලෙස විශ්වාස කරති. නිවසේ ශ්‍රමය බෙදීම, කාන්තාවන්ගේ වැඩ සහ කාන්තාවන්ගේ තැන ලෙස පමණක් පිළිගැනෙන ක්‍රියාකාරකම් වලදී පිරිමින්ගේ සහයෝගිත්වය සහ සහාය, ඍණාත්මක සමාජ සම්මතයන් විසින් ශක්තිමත් කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාව පක්ෂග්‍රාහීබව අඩුවීම, සමාජයේ බොහෝ ක්ෂේත්‍ර තුළ සමාන අවස්ථා වැඩි වීම, වඩාත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සේවා සහ කාන්තාවන් ආර්ථික සමාජමය සහ චිත්තවේගීව වශයෙන් පිරිමින් මත යැපීම අඩු වීම මෙයට සාක්ෂි දරයි.

කාන්තා අයිතිවාසිකම් සංවිධාන ඔවුන් කරන වැඩ සහ ඔවුන් එම වැඩ කරන ආකාරය සැබැවින්ම ස්ත්‍රීවාදී බව නිගමනය කරති. කාන්තාවන්ගේ හඬ, නියෝජිතත්වය සහ සවිබල ගැන්වීම අත් කර ගැනීම, කාන්තාවන්ගේ සමානාත්මතාව සහ අයිතිවාසිකම් පිළිගැනීම සහ බොහෝ ක්ෂේත්‍ර තුළ පුරුෂාධිපත්‍යය බිඳ දැමීම කරා විශ්වාසයෙන් යුතුව ක්‍රම ක්‍රමයෙන් ගමන් කිරීම පිළිබඳව ඔවුහු කථා කරති.

ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ සමානාත්මතාවය කරා වැඩ කිරීමට ස්ත්‍රීවාදී ප්‍රවේශ භාවිතා කරන ස්ත්‍රීවාදී සංවිධාන ලෙස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ හවුල්කරුවෝ තමන්ව සාඩම්බරයෙන් හඳුන්වා ගනිති.

In partnership with Canada

The Asia Foundation

**ව්‍යාපෘතිය ගැන:** ශ්‍රී ලංකා කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතිය, කැනේඩියානු රජයේ අරමුදල් මගින් ආසියා පදනම විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි. කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන කාන්තා නායකත්වයක් යටතේ පවතින දේශීය කාන්තා අයිතීන් පිළිබඳ කටයුතු කෙරෙන සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා ධාරිතාව වර්ධනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

**මෙම ලේඛනය පිළිබඳ අදහසක්:** ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ සන්නිවේදන උපාය මාර්ගයේ අංගයක් ලෙස ගොඩනගන ලද "ප්‍රවේශය පිළිබඳ සටහන් පත්‍රිකා" නම් වූ විස්තර පත්‍රිකා මාලාව, ව්‍යාපෘති කණ්ඩායම විසින් විවිධ ව්‍යාපෘති අරමුණු ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරන ලද ප්‍රවේශයන්, සාක්ෂාත් කරගත් ප්‍රතිඵල, දැනුම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය අතරතුර උගත් පාඩම් පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. මෙම ලේඛනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ගමන් මග තුළ ගැඹුරු චින්තනයක් සහිත මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරන අතර එහි ජයග්‍රහණ හැඩගැස්වීමේදී ස්ත්‍රීවාදී ප්‍රවේශයන්ගේ වැදගත්කම අවධාරනය කරයි.

**කාන්තා හඬ සහ නායකත්වය - ශ්‍රී ලංකාව**
ආසියා පදනම
30/1, බගතලේ පාර, කොළඹ 3.
දුරකථන: +94 11 2058701
විද්‍යුත් තැපෑල: අඩක්ෟස්දෙමබෝඑසදබගදරට